
නිලන්ත හෙට්ටිගේ

භාවනාව සහ සත්‍යාවබෝධය පිළිබඳ රහස් රැසක් ඇතුළත්ය.

# මහා යෝගියෙකු සමග දොළොස් වසරක්



# කර්තෘගේ වෙනත් කෘතීන්

## බෞද්ධ ග්‍රන්ථ

1. භාවනාව සහ අධ්‍යාත්මික දියුණුවේ රහස්
2. උසස් භාවනාව සහ අධිමානසික බලය
3. සමාධිය සහ ප්‍රඥාව වඩන ආනාපානසති භාවනාව
4. භාවනාව, මිනිස් සිත සහ නිවන
5. භාවනාව කුණ්ඩලිනි බලය සහ අධිමානසික විද්‍යාවේ රහස්
6. භාවනා රහස්
7. ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ භාවනාව
8. භාවනා උපදෙස් සහ සත්‍යාවබෝධයට නොවරදින මග
9. භාවනාව සහ චිත්ත ශක්තිය
10. භාවනාව යෝග සහ චිත්ත ශක්තිය
11. සතිපට්ඨාන භාවනාව සහ නිවන් මග
12. භාවනා උපදේශ සංග්‍රහය
13. භාවනා අභ්‍යාස සහ සත්‍යාවබෝධය
14. අධිමානසික විද්‍යාවේ හාස්කම්
15. බෞද්ධ භාවනා සහ මාර්ගඵල
16. විදර්ශනා භාවනාව සහ ධර්මාවබෝධය
17. අභිධර්ම ප්‍රවේශය
18. සදහම් සයුර
19. විදර්ශනා මාර්ගය
20. සෝවාන් මාර්ගය සහ සෝවාන් ඵලය
21. නුවණ වඩන බණකතා
22. භාවනාවේ හාස්කම්
23. ජීවිතය මරණය සහ පුනරුත්පත්තිය
24. භාවනා පුහුණුව
25. භාවනාව ධ්‍යාන සහ මාර්ගඵල විනිශ්චය
26. භාවනාවේ ආශ්චර්යය
27. සතරමග සතරඵල
28. ප්‍රායෝගික විදර්ශනා භාවනාව
29. භාවනා මාර්ගය
30. භාවනාවේ විස්මිත රහස්
31. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සහ අක්ෂෝභය තන්ත්‍රය
32. භාවනාවේ දිව්‍යමය රහස්
33. ධර්ම විනිශ්චය
34. කසිණ භාවනා රහස්
35. භාවනාවේ අනුහස්
36. සදහම් කැටපත
37. භාවනා අත්පොත
38. විපස්සනා භාවනාව
39. සදහම් සරණ
40. යෝග විද්‍යාවේ රහස්
41. බුද්ධානුස්සති භාවනාව
42. වජ්‍රසත්ව සූත්‍ර නිර්දේශය
43. භාවනාවේ ස්වර්ණමය රහස්
44. සසර ගමන සහ සෝවාන්ඵලය
45. බෞද්ධයාගේ භාවනා අත්පොත
46. භාවනාව සහ කුණ්ඩලනී බලය
47. භාවනාව සහ අධිමානසික හැකියාව

## මනෝවිද්‍යාව සහ දාර්ශනික මතවාද

48. ජීවිතයේ දියුණුවට දාර්ශනික රහස්
49. දියුණුව සහ ජයග්‍රහණය ගෙනදෙන ස්වර්ණමය රහස්
50. ධනය බලය සහ දියුණුව පිළිබඳ මනෝවිද්‍යාත්මක රහස්
51. සුපිරි මනස සහ සුපිරි බලය
52. එදිනෙදා ජීවිතයට අධිමානසික විද්‍යාව

## භාෂා අධ්‍යයනය

53. ඉංග්‍රිසියෙන් ලිපි ලේඛන සැකසීම
54. ප්‍රායෝගික ඉංග්‍රිසි කථනය
55. ඉංග්‍රිසි යෙදුම් අත්පොත
56. ඉංග්‍රිසි ව්‍යාකරණ අත්පොත
57. ඉංග්‍රිසි භාෂාවේ ප්‍රවීණයෙකු වන මග

## නීතිය

58. අපරාධ නීතිය
59. පොදුජන නීති අත්පොත
60. ඉඩම් නීතිය
61. විවාහය සහ නීතිය
62. ජීවිතය සහ නීතිය
63. ඔබට බලපාන නීතිය
64. නීතිය යුක්තිය සහ අධිකරණය
65. නීති සහ නීතියේ ක්‍රියාකාරිත්වය
66. ශ්‍රී ලංකාවේ නීතිය සහ අධිකරණ ක්‍රමය
67. සාක්ෂි නීතිය සහ නඩු ඇසීමේ ක්‍රියාවලිය
68. එදිනෙදා ජීවිතයේ නීති ගැටලු
69. සිවිල් නීතිය සහ නඩු කාර්ය පටිපාටිය
70. සාක්ෂිය නීතිය
71. කම්කරු නීතිය
72. අපරාධ නීතියේ මූලධර්ම
73. අපරාධ නඩු විධාන නීතිය
74. අපරාධ නීතිය සහ සාපරාධී වගකීම
75. පොදු ජන නීති අත්පොත නව සංස්කරණය
76. අපරාධ නීතිය සහ දණ්ඩ නීති සංග්‍රහය
77. පරිපාලන නීතිය සහ සේවක අයිතිවාසිකම්
78. ප්‍රායෝගික ඉඩම් නීතිය
79. ඉඩම් නීතියේ සංකල්ප සහ භාවිතය
80. නීති ප්‍රවේශය
81. මෝටර් රථ ප්‍රවාහන නීතිය
82. ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය
83. ශ්‍රී ලංකාවේ ඉඩම් නීතිය
84. ඉඩම් ආරවුල් සහ 66වන වගන්තියේ නඩු

## වෙනත් කෘතීන්

85. සටන් කලාව
86. ගුප්ත විද්‍යාව සහ අමනුස්ස ලෝකය
87. ජීවිතය සහ මරණය පිළිබඳ විස්මිත රහස්
88. අන්තරාභවය සහ මළවුණ්ගේ ලෝකය
89. මළවුණ්ගේ ලෝකයේ අභිරහස්
90. විශ්ව ශක්තිය සහ සුවකිරීමේ බලය
91. විශ්වයේ විස්මිත අභිරහස්
92. ගුප්ත විද්‍යාව සහ අධිමානසික හැකියාව
93. ගුප්ත විද්‍යාවේ අභිරහස්
94. ඩිජිටල් ඡායාරූපකරණය
95. පිටසක්වල ජීවීන්ගේ විස්මිත රහස්
96. ලොව හෙල්ලූ විස්මිත අභිරහස්

CS CamScanner

# පෙරවදන

මා පුද්ගල චරිතාපදානයන් කියවනුයේ කලාතුරකිනි. ඊට මූලික හේතුව වී ඇත්තේ මෙරට ලියවෙන පුද්ගල චරිතාපදානයන් වැඩි ප්‍රමාණයක සාහිත්‍යමය රසයක් නොතිබීමයි. ඒවා කියවා රසවින්දනය කළ නොහැකි වීමයි. ඒවායින් ජීවිතයට එක්කරගත හැකි පාඩම් ඔය කියන තරම් නොමැති වීමයි. මේ දක්වා පොත් 130 ක් වැනි ප්‍රමාණයක් මවිසින් ලියා පළකරන්නට යෙදුනද ඒ අතර පුද්ගල චරිතාපදාන පොත් ඇත්තේ එකකි. ඒ මහායෝගී පද්මසම්භවගේ චරිතාපදානයයි. මා පද්මසම්භවගේ චරිතාපදානය ලියා පළ කරන ලද්දේ නාරෝපාගේ චරිතාපදානය ලිවීමට පෙරහුරුවක් වශයෙනි. නාරොපා සහ පද්මසම්භව යන දෙදෙනාම සම්මත බෞද්ධ ඇදහිල්ල උඩු යටිකුරු කිරීමට කටයුතු කළ විප්ලවකාරී චරිත දෙකකි. ඔවුන්ගේ චරිතාපදානයන් කියවීමෙන් බෞද්ධයන්ට ඉගෙනගත හැකි පාඩම් බොහෝය.

නාරොපාගේ චරිතාපදානය පද්මසම්භවයන්ගේ ජීවිත කථාවට වඩා රසවත්ය. එහි එන සෑම ඡේදයකින්ම කුමක් හෝ පාඩමක් ජීවිතයට එක් කර ගත හැකිය. මම දැනට වසර හතකට පමණ කලින් නාරොපාගේ ජීවිත කථාවේ තැන් කිහිපයක් කතා පොතකට එක් කළෙමි. ඒ පොත පාඨකයන්ගේ නිරන්තර අවධානයට ලක්වෙමින් තවමත් වරින්වර මුද්‍රණයෙන් පිටවෙයි. දැනට වසර හතරකට නැත්නම් පහකට පෙර රන්දිව නම් පුවත්පතෙහි නාරෝපාගේ ජීවිත කථාවෙන් කොටසක් පළකළෙමි. ඒ ලිපි පෙළ කියවූ බොහෝ දෙනෙක් ඒ ලිපි කපා වෙන්කර මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත්හ. නාරොපාගේ ජීවිත කථාව ඒ තරමටම පුදුම සහගතය. ඒ තරමටම සාහිත්‍ය රසයෙන් අනූනය.

අපගේ කෘතියෙහි ප්‍රධාන චරිතය වන නාරෝපා ජීවත්වූයේ ථේරවාදය පසුබැස ගොස් මහායාන බුදුදහම ජනප්‍රියව ඇති අවධියකය. (ක්‍රි.ව.1016-1100) තිලෝපා මුනිවරයාගෙන් වජ්‍රයාන බුදුදහම ගැන උගත් නාරොපා මහායාන මහා සම්ප්‍රදායට එරෙහිව සීතල යුද්ධයක් අරඹමින් වජ්‍රයානය සිය ගෝල පරපුරට දායක කරදෙයි. අභාග්‍යයකට මෙන් ඉන්දියාවෙහි ථේරවාදයත් වජ්‍රයානයත් මහායානයත් ක්‍රිස්තුවර්ෂ 12වන සියවසේ සිදුවූ මුස්ලිම් ආක්‍රමණයන් නිසා සම්පූර්ණයෙන්ම අතුරුදන් වෙයි. අවසානයේ වජ්‍රයානය

ටිබෙටය, භූතානය, නේපාලය වැනි රටවල් කිහිපයක ඉතිරිවන අතර මහායානය හා ථේරවාදය නැගෙනහිර ආසියානු රටවල් කිහිපයක ඉතිරිවෙයි. බුදුදහම ගැන තුලනාත්මක අධ්‍යයනයක් කිරීමට කැමති සෑම කෙනෙකු විසින්ම වජ්‍රායන ඉගැන්වීම් ගැන ප්‍රමාණවත් දැනුමක් ලබා ගත යුතුය. ලංකාවේ වෙසෙන බෞද්ධයන්ගෙන් අති බහුතරයක් වජ්‍රයාන යන නමෙන් ඔබ්බට ඒ ගැන කිසිවක් නොදනිති. වජ්‍රයාන බුදුදහම යනු පිටසක්වල වැඩවෙසෙන මුනිවරුන් බුදුවරුන් බෝසත්වරුන් හා මහායෝගීන් විසින් මෙලොව වෙසෙන බෞද්ධයන්ට අනුකම්පාවෙන් දේශනා කරන ලද ඉගැන්වීම් සමුදායකි. ඒ ඒ ලෝකධාතුන්හි ඉගැන්වෙන බෞද්ධ භාවනා ක්‍රම යෝග ක්‍රම හා රෝග නිවාරණ ක්‍රම වැනි ඉගැන්වීම් රාශියක් වජ්‍රයානයට ඇතුළත්ය.

මා මුලින්ම වජ්‍රයාන ඉගැන්වීම් හදාරන ලද්දේ ඒ ගැන ලියැවුණු පොතපතෙනි. පුදුමයකට මෙන් ඒ පොතපතෙහි එන භාවනා ක්‍රම මා උගත් සම්ප්‍රදායික අභ්‍යාසවලට වඩා ශීඝ්‍රයෙන් මට ජීර්ණය විය. අවසානයේ සිදුවූයේ අනපේක්ෂිත දෙයකි. වජ්‍රයානයෙහි එන මුනිවරු හා බෝසත්වරු මා කෙරෙහි අනුකම්පා කර සත්‍යාවබෝධය පිළිබඳ රහස් රැසක් මා වෙත ලබා දුන්හ. වඩාත්ම විස්මය ජනක කරුණ වන්නේ මා ඇසුරු කරමින් භාවනා කළ සමහරුන් දිගින් දිගටම වජ්‍රයාන මුනිවරුන් ඇසුරු කර අත්දැකීම් හුවමාරු කරගැනීමට සමත්වීමයි.

වජ්‍රයාන බුදුදහමේ එන මුනිවරුන් මා වෙත කියා දුන් රහස් රැසක්ම මේ වන විට ම විසින් පොත පත ඇසුරෙන් ප්‍රසිද්ධියට පත් කර ඇත. බුදුදහම පිළිබඳ මට වඩා දැනුම් සම්භාරයක් රැස්කරගෙන සිටින විශ්වවිද්‍යාල මහ ඇදුරෝ පවා අද ඒ වජ්‍රයාන ඉගැන්වීම් කියවා ඒ අනුව කටයුතු කරති. ඒ අනුව තම ජීවිත හැඩගස්වා ගනිති. මුල් වජ්‍රයාන ඉගැන්වීම් ඉතා පැහැදිලිවම පරම්පරා දෙකකට බෙදා වෙන් කළ හැකිය. පද්මසම්භවයන්ගේ ඉගැන්වීම් ඉන් පළමු පරම්පරාවට අයත්වෙයි. තිලෝපා, නාරොපා මර්පා, මිලාරෙපා යන ගුරු පිරිසෙන් දෙවැනි වජ්‍රයාන ඉගැන්වීම් පෙළ එළිදැක්වෙයි. මුල් වජ්‍රයාන පරපුර නයින්ග්මා ලෙසද දෙවන පරපුර සර්මා ලෙසද හැඳින්වෙයි. නයින්ග්මා හා සර්මා යන පරම්පරා දෙකෙහිම අරමුණ එකක් විය. ඒ අරමුණ පැහැදිලිය. මෙලොවදී කිසි ප්‍රතිඵලයක් ලබා ගත නොහැකි මහායාන මහා සම්ප්‍රදායට අභියෝග කිරීම ඒ අරමුණයි.

වජ්‍රයානය යනු මහායානය තුළින් නැගී සිට මේ ආත්මභාවය තුළ නිවන්පුර දොර ඇර ගැනීමට යොමුවන අපූරු මාවතකි. වජ්‍රායන බුදුදහම මෙරට බෞද්ධයන්ට ආගන්තුකය. සමහරු වජ්‍රායන යන නම ඇසූ පමණින් ඒ වෙනත් ආගමක්දැයි අසති. වජ්‍රයානය වෙනත් ආගමක් නොවේ. නිවන කරා යාමට හැකි සම්ප්‍රදායික නොවන මාවත් රැසක් වජ්‍රයානයෙන් අපට හඳුන්වා දෙයි. මා වජ්‍රයානය උගත්තේ ආගන්තුකයෙකු ලෙසය. එනමුත් අද ආපසු හැරී බලන විට මා වජ්‍රයාන මාවතේ සෑහෙන දුරක් ගොස් අවසන්ය.

වජ්‍රයානය ඔබ සිතනවාට වඩා අතිශයින් ශක්තිමත් සම්ප්‍රදායකි. එය උදාහරණයක් තුළින් පහසුවෙන් පහදා දිය හැකිය. අප රටේ බෞද්ධයෝ බෝධිපූජා, දේවපූජා ආදී විවිධාකාර උපචාර විධි අනුගමනය කරමින් තමන් මුහුණ පා සිටින කරදර වලින් මුදාහරින මෙන් ඉල්ලා බාරහාර වෙති. ඔවුන් ඒ ඉල්ලීම් කරන්නේ කාගෙන්ද? විෂ්ණු, ස්කන්ධ කුමාර පත්තිනි වැනි හින්දු ඇදහිල්ලට අයත් දෙවියන්ගෙනි. ථෙරවාදී බෞද්ධයන්ට තම දුක් ගැනවිලි කීමට ජීවමාන නායකයෙකු නැත. සතහට අපමණ සෙත සැලසූ බුදුහිමියන් අද මිහිපිට නැත. සැරියුත් මුගලන් අගසව් දෙනම අද මිහිපිට නැත. හින්දු ආගමට අයත් දෙවි දේවතාවන් මෙරටට ආනයනය කිරීමට ඔවුන්ට සිදුවන්නේ ඒ හේතුව නිසාය.

මහායෝගී නාරොපා විසින් අතිශය දුෂ්කර මාර්ගයක් ඔස්සේ තිලෝපා මුනිවරයා සොයාගොස් වජ්‍රයාන රහස් උගත් ආකාරයත් නාරොපාගේ ජීවිතයේ ඔහු මුහුණ දුන් සුවිශේෂී අත්දැකීම් පිළිබඳවත් මෙම කෘතියෙහි විස්තරාත්මකව සඳහන් කර ඇත. මෙහි එන සෑම කථා ප්‍රවෘත්තියකම ජීවිතය පිළිබඳ කිසියම් ගැඹුරු සත්‍යයක් විස්තර කෙරෙන අතර මතුපිටින් පෙනෙන කථාවට යටින් දිවෙන ගැඹුරු ඉගැන්වීම් වටහා ගැනීමට පාඨකයා සෑම විටම උත්සාහ කළ යුතුය.

**නීතිඥ නිලන්ත හෙට්ටිගේ**
'සුනිල'
කලහ, වංචාවල

CamScanner

# පටුන


පිටු අංක

| | | |
|---|---|---|
| 01. | නාරොපාගේ ජීවිතයේ මුල් අවධිය | 09 |
| 02. | නාලන්දා විශ්වවිද්‍යාලයේ ගතවූ කාලය | 12 |
| 03. | හදිසියේම පැමිණි අවලස්සන ස්ත්‍රිය | 13 |
| 04. | නාරෝපා දුෂ්කර ගමනකට අවතීර්ණ වෙයි. | 15 |
| 05. | වධක රස්සාවට ආරාධනයක් | 20 |
| 06. | වැරදි පාරක ගොස් අතරමංව | 25 |
| 07. | හොඳ හොඳ සෙල්ලම් එළිවෙන ජාමෙට | 33 |
| 08. | නාරොපා පුල්ලහාරියට පැමිණෙයි | 35 |
| 09. | ගුරු ඇසුරෙහි ජීවිතය | 40 |
| 10. | භයානක අභ්‍යාස මාලාවක් | 45 |
| 11. | නාරොපා, මාතංග තවුසාගේ චරිතයට පණදෙයි | 50 |
| 12. | නාරොපා සිවුරු හැර විවාහ වෙයි. | 55 |
| 13. | අන්තරාභවය තුළ පරිනිර්වාණය | 57 |
| 14. | තිලෝපා මුනිවරයාගෙන් කදිම භාවනා පාඩමක් | 60 |
| 15. | අවසන් උපදේශය සෙරෙප්පු පහරකි! | 63 |


CamScanner

# 01

# නාරොපාගේ ජීවිතයේ මුල් අවධිය

ද ඔදිව පෙරකල පැවති සම්ප්‍රදාය අනුව ධනවත් පවුල්වල ගැහැනු පිරිමි කවුරුත් සොළොස් වන වියට පැමිණෙන විට විවාහ වූහ. බුදුසමය ඒ වන විට පසුබසිමින් තිබූ අතර හින්දු ආගම යළි හිස ඔසවන තත්ත්වයක් ඉන්දියාවේ සෑම පෙදෙසකින්ම දැකගත හැකිවිය.

1016 වන වර්ෂයේ බෙංගාලයේ පොහොසත් බ්‍රාහ්මණ පවුලක උපන් නාරොපා ඒ වන විට සොළොස්වන වියට පා තබා සිටියේය.

"දැන් ඉතින් අපේ නාරෝ කොලුවටත් හොඳ තැනකින් කටයුත්තක් ලැහැස්ති කරන්න ඕන." නාරොපාගේ පියා ඉස්තෝප්පුවේ හිඳගෙන කාටත් ඇසෙන්නට කීය.

"හැබැයි කොලුව හරි අමුතු එකා. ඒකා ගත් කටටම කියාවිද දන්නෙ නෑ කසාද බඳින්න බෑ කියල. ඔහේම අහල බැලුවනං හොඳයි නේද?" පියාගේ කථාව අසා සිටි මව කීය.

"නාරෝ, මයෙ පුතේ මෙහෙ වරෙංකො පොඩියක්." හේ පියාගේ කැඳවීමට කීකරුව ඔහු ළඟට පැමිණියේය.

"අපේ පරම්පරාවෙ පිළිගත්ත චාරිත්තර අනුව තරුණ වයසට ආපු කෙනෙක් එක්කො කසාද බඳින්න ඕන. නැතිනම් තපසට යන්න ඕන. මයෙ පුතාට මං කියනදේ තේරෙනව නේ?"

"මට තේරෙනව අප්පච්චි. කසාද බඳින්න මයෙ අකමැත්තක් නෑ. හැබැයි මම කියන හැඩරුව තියෙන මනමාලියෙක් මට ඕන."

"හොඳයි කියාපංකො බලන්න."

"කෙල්ල හැඩවෙන්න ඕන. කොණ්ඩෙ තඹ පාටට දිගට තියෙන්න ඕන. මගේ වයසෙම වෙන්නත් ඕන. හින්දු පවුලක උපන් අයෙක් වෙන්න ඕන. බ්‍රාහ්මණ කුලේ වෙන්න ඕන. සංග්මෝ කියන නම තියෙන්න ඕන."

"එච්චරද? හැබැටම උඹට ඔල්මාදෙ හැදිලද? තඹපාට හිසකේ තියෙන ගෑනු මම කොහෙන් හොයන්නද? ඇරත් සංග්මෝ කියන නම තියෙන කෙනෙක්ම හොයන්නෙ කොහොමද?"

එවේලේ නාරොපාගේ මව මැදිහත්වූවාය.

"කමක් නෑ අපෙ රාලහාමි. කොලුවගෙ ආසාවනෙ. අපි ටිකක් විපරං කරල බලමු. ඒ නම තියෙන ඒ විස්තරවලට ගැළපෙන කෙල්ලෙක් ඉන්නවද කියල."

නාරොපාගේ පියාට කදිම අදහසක් පහළ විය. ඔහුගේ එක් මිත්‍රයෙක් රස්සාව හැටියට කළේ මඟුල් කපුකමයි. හේ තම පුත්‍රයාට ගැළපෙන මනාලියක් සෙවීමේ කටයුත්ත තම මිත්‍ර මඟුල් කපුවාට භාර දුන්නේය. මඟුල් කපුවා ළඟපාත ගම්දනව් පීරා සෑම තැනකම හෙව්වත් ඒ කියන සුදුසුකම් ඇති කෙල්ලක් සොයා ගැනීම දුෂ්කර විය. මේ අතර එක්තරා දිනක වෙන ගමනක් යමින් සිටි මඟුල් කපුවාට මල් නෙළමින් සිටින කෙල්ලන් පිරිසක් දිස්විය. ඔවුණ් අතර වූ එක් අයෙකුගේ හිසකේ තඹ පැහැයට හුරුවිය. මඟුල් කපුවා ඉවසිලිමත්ව වැඩේට අතගැසුවේය. කෙල්ලන් පිරිස මල් නෙළාගෙන නොගැඹුරු ගඟකින් බැස එතෙරවී ගෙවල් බලා යමින් සිටියහ. අන් අය තමන්ගේ ඇඳුම් ඔසවාගෙන ගඟෙන් එතෙර වුවත් තඹ පැහැ හිසකේ ඇති කෙල්ල වඩාත් සංවරව ඇඳුම් තෙමී තෙමී ගඟදියේ බැස ගියාය.

"නංගිල මල් කඩන්න ගිහින් වගේ." කපුවා කෙල්ලන්ට කිට්ටුවී ඇසීය.

"ඇයිමාමත්මල්කඩන්නආවද?"එකියක්කපුවාටඇනුම්පදයක් කීය.

"නෑ මම මල් කඩන්න නෙවෙයි ආවෙ. මට ඕන අර තඹ පාට හිසකේ තියෙන ගෑනු ළමයගෙ නම දැනගන්න."

"එයා තමයි සංග්මෝ. පදිංචිය අර ජේන බමුණු ගමේ."

මගුල් කපුවාට ඇති වූයේ කිව නොහැකි තරම් සතුටකි. හේ වහ වහාම තම මිත්‍රයා හමුවී නාරොපාට ගැළපෙන මනාලියක් සොයාගත් පුවත දැන්විය. නාරෝපා සහ සංග්මෝ අතර විවාහය හින්දු චාරිත්‍රානුකූලව උත්කර්ෂවත් ලෙස පැවැත්වුණි.

කාලය කාහටත් නොදැනී ගලා යයි. සංග්මෝ නාරෝපා යුවල අවුරුදු නවයක් තිස්සේ සිය විවාහ ජීවිතය සතුටින් පවත්වාගෙන ආහ. ඒ වන විට නාරොපාගේ වයස අවුරුදු විසිපහකි. හේ සංග්මෝ අමතා තමන්ගේ අදහස් කියා පෑවේය.

"ඇත්තටම ගිහි ජීවිතය කියන්නෙ මෙලොවටත් පරලොවටත් දෙකටම නැති එකක්. ගිහි ජීවිතේට ආපු කෙනා දිගින් දිගටම ඇලීම් ගැටීම් ඇතිකරගෙන සංසාරෙ කෙළවරක් නැතිව දික්කර ගන්නවා. අන්තිමට ආපස්සට හැරිල බැලුවම නටපු නැටුමකුත් නෑ. බෙරේ පලුවකුත් නෑ. අපි අත්විඳින සැප හරියට හීනයක් වගේ. ඇත්තටම පැවිදි ජීවිතේ ඒ වගෙ අනතුරක් නෑ. මුළු දවසම වුණත් බණ භාවනා කරල සංසාරෙ කෙටි කරගන්න පුළුවන්."

නොසිතුවක්ම සිදුවිය. නාරොපාගේ අදහසට සංග්මෝ පූර්ණ එකඟත්වය පළ කළාය. ඇයට ද ගිහි දිවියෙන් ඉවත්ව පැවිදි දිවියට පිවිසීමට අවශ්‍ය විය. අවසානයේ දෙදෙනාම එක්ව නිවසෙන් පිටත්ව මහණදම් පිරීම සඳහා ගුරුවරුන් සොයා ගියහ.

02

# නාලන්දා විශ්වවිද්‍යාලයේ ගතවූ කාලය

නාරොපා සිය ප්‍රියාදර බිරියගෙන් වෙන්ව ගුරුන් සොයා ගොස් අවසානයේ නාලන්දා විශ්වවිද්‍යාලය කරා ගියේය. එහිදී පැවිදි ජීවිතයක් ගත කළ හෙතෙම ථේරවාද, මහායාන යන බෞද්ධ සම්ප්‍රදායන්ට අයත් ඉගැන්වීම්වල කෙළ පැමිණියේය. නාරොපාගේ දක්ෂතාව ගැන පැහැදුණු නාලන්දාවේ පාලන අධිකාරිය විසින් ඔහුට එහි බටහිර පියයේ අධිපතිකම ලබා දෙන ලදී.

ථේරවාද මහායාන යන මහා සම්ප්‍රදායන් දෙකෙහිම කෙළ පැමිණිය ද නාරොපා වැඩි උනන්දුවක් දක්වන ලද්දේ තාන්ත්‍රික ඉගැන්වීම් කෙරෙහිය. තාන්ත්‍රික ඉගැන්වීම්වල ආරම්භය පිළිබඳව ඇත්තේ ද පුදුමාකාර කථාවකි. බුද්ධ කාලයේ ඔඩ්ඩියාන නම් රටෙහි ඉන්ද්‍රභූති නම් රජෙක් විය. ගෞතම බුදුන්වහන්සේ ඍද්ධි බලයෙන් ඔඩ්ඩියාන දේශයට වැඩම කර ඉන්ද්‍රභූති නම් රජුට බණ කීසේක. දේශනාව අසා සිටි ඉන්ද්‍රභූති රජු නිතර දෙවේලේ ආරක්ෂාවට භාවිත කළ හැකි යමක් දේශනා කරන මෙන් ඉල්ලා සිටියේය. ඔහුට අනුකම්පා කළ බුදුන්වහන්සේ බුදුවරුන්ගෙන් සැදුණු මණ්ඩපයක් සිතෙන් මවාගෙන තමන් ඒ තුළ සිටින්නාක් මෙන් චිත්තරූප මවන්නැයි දේශනා කළහ. ඔඩ්ඩියාන රජුට දුන් උපදෙස් අනුව පසු කලෙක හේවජ්‍ර මණ්ඩල නම් අභ්‍යාස විධියක් ජනප්‍රිය විය. ඒ අභ්‍යාස විධීන් ඇතුළත් කර ක්‍රිස්තු වර්ෂ හතරවන සියවසේ දී පමණ ගුහ්‍ය සමාජ තන්ත්‍ර නම් ග්‍රන්ථයක් එළිදක්වන ලදී.

# 03

# හදිසියේම පැමිණි අවලස්සන ස්ත්‍රිය

එදින නාරෝපා නාලන්දාවේ එළිමහනට වී ගුහ්‍ය සමාජ තන්ත්‍රය හඬ නගා කියවමින් සිටියේය. ඒ අසලින් ගිය අවලස්සන ස්ත්‍රියක් නාරෝපාට කිට්ටු වූවාය.

"හැබෑටම ඔහේ කියවන පොත මොකක්ද?"

"මේක තමා ගුහ්‍ය සමාජ තන්ත්‍රය කියන්නෙ."

"හරි සතුටුයි. හරිම සතුටුයි. අපේ මල්ලිත් ඔය පොත නිතරම කියවනවා. උන්දැට ඒක කටපාඩම්."

අවලස්සන ස්ත්‍රියගේ ප්‍රශංසාව ඇසූ නාරෝපා ඇයව තවදුරටත් සතුටු කිරීමට සිතුවේය.

"මම ගුහ්‍ය සමාජ තන්ත්‍රය කියවනව විතරක් නොවෙයි. මට ඒකෙ ගැඹුරු අර්ථයන් පවා තේරෙනවා."

එවර ඇගෙන් දිස්වූයේ කිසිසේත් අපේක්ෂා නොකළ ප්‍රතිචාරයකි. අවලස්සන ගැහැනියට හොඳටම කේන්ති ගියේය.

"අනේ ඇත්තටම ඔහෙත් බුද්ධ පුත්‍රයෙක්ද? ලැජ්ජ නැතිව කියන හැටි ගුහ්‍ය සමාජ තන්ත්‍රය තේරෙනවයි කියල?"

"ඇයි මට ඒක තේරෙන්නෙ නැති බව ඔහේ දන්නෙ කොහොමද?"

"මම ඔහේට ඒකෙ තියෙන දේ තේරෙනවද නැද්ද දන්නෙ නෑ. ඒත් අපෙ මලය කවදත් කියන්නෙ එයා විතරයි ගුහ්‍ය සමාජ තන්ත්‍රයේ තියෙන දේ වටහ ගෙන තියෙන්නෙ කියල."

"මල්ලිගෙ නම මොකක්ද?"



CamScanner

"එයාගෙ නම තිලෝපා. එයා කලින් රජ සැප විඳපු ඔටුනු පලන් රජ කෙනෙක්. ඒත් උන්දැට මොකක්ද දිස්වියකින් කියල තියෙනවා සත්‍යාවබෝධය ලබන හැටි. එයා ඒ පාරෙ ගිහින් තපස් රකල සත්‍යාවබෝධය ලබලයි ඉන්නෙ."

තිලෝපා යන නම කියූ සැණින් නාරෝපාගේ කුතුහලය ඇවිස්සී ගියේය.

"හැබෑටම මට හොඳටම හුරු නමක්. කවුද ඒ තිලෝපා කියල කියන්නෙ? එයා කොහෙද ඉන්නෙ."

"මලය දැනට ඉන්නෙ නම් පුල්ලහාරියෙ ගල් ගුහාවක. ඔහේට එතනට යන්න එච්චර ලේසි නෑ. ඒත් පුල්ලහාරියට ගිහින් ඇහැව්වම තිලෝපා මුනිවරයා ඉන්න තැන පෙන්නන්න කියල කවුරු වුණත් ඔහේට එයා ඉන්න තැන පෙන්නාවි."

මේවන විටත් නාරෝපා නොදත් අද්භූත ක්‍රියාදාමයක් ආරම්භ වී අවසන්ය. හේ පැහැදිලි කළ හැකි හේතුවක් නොමැතිව ලහි ලහියේ නාලන්දාවේ සිට පුල්ලහාරියට ඉරණම් ගමනක් යාමට වහ වහා ලකලෑස්ති වූයේය.

"මම අද ඉල්ලා අස්වෙනවා." හේ නාලන්දාවේ පාලන අධිකාරයට තම ඉල්ලා අස්වීම පිළිබඳව දැනුම් දුන්නේය.

"ඇයි ඔබතුමා හදිස්සියේම ඉල්ලා අස්වෙන්නෙ?"

"තිලෝපා කියල මුනිවරයෙක් ඉන්නවලු පුල්ලහාරියෙ. මට එතුමා හමුවෙලා සත්‍යාවබෝධයේ රහස් දැනගන්න ඕන."

"එතකොට මෙතන ඉන්න ළමයින්ට යන කල දවස මොකක්ද?"

"ළමයි ගැන කවුරු හරි බලා ගනීවි. මම නැතුවට දක්ෂ ගුරුවරු ඕන තරම් පහළ වේවි. ඒත් සත්‍යාවබෝධය කියන්නෙ හරිම වටින දෙයක්. මුළු නාලන්දාවෙම තියෙන පොතපත කියෙව්වත් ඒක ලබා ගන්න ලෙහෙසි නෑ. මම හෙටම පිටත්වෙනවා තිලෝපා මුනිවරයා මුණ ගැහෙන්න."

04

# නාරෝපා දුෂ්කර ගමනකට අවතීර්ණ වෙයි.

තිලෝපා යන නම ඇසීමත් සමග නාරොපාගේ සිතෙහි කුතුහලය මිශ්‍ර උනන්දුවක් ද අමුතුම ආස්වාදයක් ද ඇතිවිය. හේ නාලන්දා විශ්ව විද්‍යාලයෙන් පිටත්ව තිලෝපා මුනිවරයා සොයාගෙන නැගෙනහිර දෙසට යන්නට විය. නාලන්දාවේ සිට පුල්ලහාරිය දක්වා මාර්ගය තැනිතලා බිම් කෙත්වතු වනාන්තර පසුකරමින් රළු බෑවුම් ඇති කඳුකරයක් මැදට යොමුවිය. නාරෝපා කඳුකර මාර්ගයේ කුසගින්න සහ පිපාසය දරාගෙන ගමන් කරමින් සිටියේය. හේ ගංගාවකට සමාන්තරව ඊට ඉහළින් වැටී තිබූ දුර්ග මාර්ගයක ගමන් කරමින් සිටියේය.

එකල ඉන්දියාවේ තැනින් තැන ලාදුරු රෝගය පැතිර යමින් තිබුණි. ලාදුරු රෝගය වැළඳුනු අයගේ ඇඟිලි විකෘති වී තුවාළ සෑදෙයි. සමහරුන්ගේ තුවාල කුණුවී ඇඟිලි හැලේ. තව සමහරුන්ගේ නාසය පවා දියවී යයි. ලාදුරු රෝගය පහසුවෙන්ම බෝ වේ. රෝගය අන් අයට බෝවීමෙන් වළක්වනු පිණිස ලාදුරු රෝගීන් වන දුර්ග වෙත පළවා හැරීමේ සිරිතක් එකල විය.

අවාසනාවක මහත. නාරෝපා යන මඟ අවුරාගෙන ලාදුරු රෝගී මැහැල්ලක් පාරේ හිඳගෙන සිටියි. ඈ තරම් අවලස්සන කාන්තාවක් නාරොපා තවත් දැක ඇත්නම් ඒ පෙරදින නාලන්දාවේදී දුටු අවලක්ෂණ ස්ත්‍රිය පමණි. පුදුමයකට මෙන් නාලන්දාවේදී දුටු ස්ත්‍රියත් ලාදුරු රෝගී කාන්තාවත් මුහුණුවර අනුව බොහෝ දුරට සමාන විය.

"ඔහේ මොකද මෙතන පාර හරස් කරගෙන කරන්නෙ?"

"මට යන්න එන්න තැනක් නෑ."

"යන්න එන්න තැනක් නෑ කියල පාර හරස් කරගෙන හිටියම හරියනවද? ඇරත් ඔය ලාදුරු බෝවුණොත් මටත් වෙන්නෙ ඔහෙත් එක්කම පාරෙ ලැගල ඉන්න. කරුණාකරල මෙතනින් අයින් වෙනවද නැද්ද?"

"එවර කාන්තාවට යකා නැග්ගේය. ඈ තද පරුෂ වචනයෙන් නාරෝපාට බැණ වදින්නට වූවාය."

"අනේ හැබැටම තමුසෙ වගේ පිංබතෙක්. පිනට හම්බුවෙන දානෙ ටික ගිලල දාල පන්සලේදි එක චරිතයක් රඟපානවා! අසරණ ගෑනු ගාව වෙන චරිතයක් රඟපානවා. බලනවකො ඔයි අර තියෙන පල්ලම දිහා. මම තමුසෙට ඉඩ දීල අයින් වෙන්න ගියොත් මට වෙන්නෙ පල්ලෙහාට වැටිල ගඟේ ගිලිල මැරෙන්න. ඒත් මං ඔහෙට උපායක් කියන්නම්. ඔහේට කැමති නම් පුළුවන් මගේ ඇඟ උඩින් පැනල අනිත් පැත්තට යන්න. ඒකට අකමැතිනම් ඔහේට පුළුවන් ආපහු හැරිල යන්න. ඔහේට එතකොට පුළුවන් පිං බත් ගිල ගිල අනුන්ට අවවාද දිදී කෙළෙස් මල්ල තව පුරවගෙන අපායටම යන්න."

නාරොපාට ඇතිවූයේ දෙගිඩියාවකි. මා මැහැල්ලට උඩින් පැන ගුරුවරයා සොයා යා යුතුද නැතිනම් ඇගේ කටට බියවී ආපසු නාලන්දාවට යා යුතුද? නෑ නෑ මම ආපු ගමන අඩියක්වත් පස්සට තියන්නෙ නෑ. මේ ඇත්තම ගෑනියෙක් නොවෙන්න පුළුවන්. සමහරවිට මාර බලපෑමක් වෙන්නත් පුළුවන්. නැතිනම් ඊයෙ දැකපු ගෑනියි අද දැකපු මේ ගෑනියි හැඩරුවෙන් එක වගේ වෙන්නෙ කොහොමද? රට්ටුන්ගෙ කයිකතන්දරවලට බයේ අතපය අකුලගෙන හිටියොත් සත්‍යාවබෝධය ලබන්න තියා එදා වේලවත් හොයාගන්න වෙන්නෙ නෑ.

නාරොපා මැහැල්ල ළඟට යන විට ඉවසිය නොහැකි දුර්ගන්ධයක් ඈ වෙතින් හමා ආවේය. ඇගේ සිරුරේ වසා සිටි තිල මැසි රොත්ත ඇවිස්සී නාරොපාගේ සිරුර වසා ගත්තා. නාරොපා නාසය හකුළුවාගෙන ඉක්මන් ගමනින් ගොස් බිම හිඳගෙන සිටි මැහැල්ලගේ ශරීරය මතින් එහා පැත්තට පැන්නේය.

"කදිමයි අපේ හාමුදුරුවොන්ගෙ තුන් පිම්ම. අනේ අම්මෙ බලමුකො හිරිකිතයක් නැතිව ගැනියෙකුගෙ ඇඟට උඩින් පැනල ගිය ලස්සන. හැබැටම දුක් විඳින අසරණයොන්ගෙ ඇඟ උඩින් පැනල ගිහින් සත්‍යාවබෝධය ලබන්න පුළුවන්ද? කවුරු කවුරුත් සමානයි කියල හිතාගෙන කා කෙරෙත් මෙත් සිත් පතුරවන්න පුරුදු වෙන්න ඕන. උස් මිටි භේද තියාගෙන කවදාවත් ඔය බලාපොරොත්තුවෙන ගමන නම් යන්න වෙන්නෙ නෑ. සත්‍යාවබෝධයට නියම මාර්ගය වෙන්නෙ තමන් තනියම එතෙර වෙන එක නෙවෙයි. තමුනුත් එතෙර වෙලා අන් අයත් එතෙර කරවන එක. ඕං මං කිව්වයි කියල හිතේ තියා ගන්න."

නාලන්දාවේ පීඨාධිපති පදවිය කලක් තිස්සේ උසුලන ලද තමන්ට බණ කියන්න ආ ඈ කවුද? ඇට වචන දෙකක් කථා කිරීමට හිතාගෙන නාරොපා ආපසු හැරී බැලීය. පුදුමයෙනුත් පුදුමයකි! මැහැල්ල ඒ වන විට අතුරුදන්ව සිටියාය. ඇගේ තුවාලවල වසා සිටි මැස්සන් රැල නාරොපාගේ සිරුරේ එල්ලී සිටියහ. හේ මැස්සන් පළවා හරිමින් නැවත ගමනාරම්භ කළේය.

"මට නාලන්දාවෙ කට්ටිය කිව්ව දේ හරි. මේ කඳුකර පෙදෙස් භූතාත්මවලින් පිරිල. ආයෙ දෙකක් නෑ ඒ නම් භූතාත්මයක්ම තමයි. මිනිස්සු ජීවත් වෙන්නෙ ආසාවල් පොදි බැඳගෙන. මැරෙන තුරුම ඒවා ඉෂ්ඨ කරගෙන අවසන් කරන්න බෑ. එකකට පස්සෙ එකක් ආසාවල් ගලා එන්නෙ හරියට උල්පතකින් වතුර එනව වගේ. මැරෙන තුරුම ආසාවල්වලින් මෑත් වෙන්න මිනිසුන්ට බෑ. ඉතිං එයාල මිය පරලොව ගිහින් තමන්ගෙ ගමට කිට්ටුව වනාන්තරවල පාළුතැන්වල භූතාත්ම වෙලා උපදිනවා. පව් අප්පා. අපි ඉතිං මොනව කරන්නද?"

නාරෝපාට සසර දුක ගැන විවිධාකාර සිතුවිලි ගලා එන්නට විය. හේ විටෙක නාලන්දාවෙන් පිටත්ව ආ ගමන ගැන පසුතැවිලි විය. තවත් විටෙක තම නොදුටු ගුරුවරයා සොයා යන වීර චාරිකාව ගැන සිතමින් සතුටු විය. කඳුකර පෙදෙස පසු කරමින් සිටි නාරොපා හොඳටම හෙම්බත් විය.

"මට වෙලාවකට හිතෙනව හැරිල ආපස්සට යන්න. කමක් නෑ. අපි පොඩියක් ගිමන් ඇරලම තීරණයක් ගනිමු."

නාරොපා කඳු බෑවුමෙ රුක් සෙවණකට වී ගිමන් හරින්නට විය. ගුරුවරයා සොයා යන ගමන කොහෙන් කෙළවර වේ දැයි කීමට නොහැකිය. හේ ගමන අත්හැර යළි නාලන්දාවට යාමට තීරණය කළේය. එවිටම වාගේ අහසෙන් පැහැදිලි කටහඬක් ඇසෙන්නට විය.

"ඒයි නාරොපා! උඹම කල්පනා කරල බලපන් ඔය දෙගිඩියාවත් එක්ක වැඩ කරල දියුණුවක් ලබන්න පුළුවන්ද කියල. ගමනක් යන්න පටන් ගත් මිනිහා ඒක අතහැරල ආපසු හැරිල යනව කියන්නෙ මොන මෝඩ කමක්ද? ඔහේ සත්‍යාවබෝධය ලබන්න නම් ඔය දෙගිඩියාව කියන එක අත්අරින්න ඕනෑ. විචිකිච්ඡාව කියල කියන්නෙත් ඔන්න ඕකටමයි. මම ඉස්සරහට යනවද නැද්ද? සසරෙ ඉන්නවද නිවන් දකිනවද? ධර්ම මාර්ගය ඇත්තද බොරුද? ඔය විධියෙ දෙගිඩියාවන් ධර්ම මාර්ගෙ යන කාටත් ඇතිවෙනවා. ඒ වෙලාවට කරන්න තියෙන්නෙ එක දෙයයි. දෙගිඩියාවට පයින් ගහල කන්දෙන් පල්ලෙහාට පෙරලල දාල තමන් යන ගමන යන්න ඕන."

නාරොපා නැවත සිතට ධෛර්යය ගෙන ගමන ආරම්භ කළේය. අහසෙන් ඇසුණු ඒ කටහඬ නාරෝපාට දැන් ටිකක් හුරුපුරුදුය. ඒ අනෙකක් නොව පැයකට හමාරකට කලින් පාර හරස් කරගෙන සිටි මැහැල්ලගේම හඬයි.

"අයියෝ මාව භූත බලවේගයකට කොටු වුණානෙ. කමක් නෑ. කමක් නෑ. කොයි කවුරු හරි වැදගත් යමක් කිව්වොත් ඒක හිතට අරන් විමසිලිමත්ව කල්පනා කරන්න ඕන. ඒ කියන උපදේසෙ වරදක් පේන්න නෑ. හොඳයි අපි ඒ උපදෙස හරි විදියටම භාර ගනිමු."

"අය්යෝ මේ මොකෙක්ද?" නාරෝපා පටු ගමන් මගේ ඉදිරියට තැබූ අඩිය ආපස්සට ගෙන ඉවතට පැන්නේය. මුළු ඇඟ පුරාම කුෂ්ඨයක් ඇති සුනඛයෙක් තුවාල ලැබ පාර හරහා වැටී සිටියි. මරු වියරුවෙන් කෙඳිරි ගාමින් සිටි සුනඛයා නාරොපා දැක දත් විළිස්සන්නට විය.

"හොරිකඩ බල්ලා පලයන් මෙතැනින් අහකට!"

සුනඛයා අඟලක් වත් හෙල්ලුනේ නැත. ඌ ඒ වෙනුවට වේදනාවෙන් දත් විළිස්සමින් නාරෝපාට ගොරවන්නට විය.

නාරොපා දෙවරක් නොසිතාම සුනඛයා මතින් පැන ගමන යාම ආරම්භ කළේය. ඒ හා සමඟ සුපුරුදු කටහඬ ආයෙත් අහසෙන් ඇහෙන්නට විය.

"යාළුවා තමුසෙ අර අහිංසක සතාට සලකපු හැටි හරිද? සම්පූර්ණයෙන්ම වැරදි නේ! ඒ සතා පෙර සංසාරෙ කවදාහරි තමන්ගෙ අම්ම වෙලා ඉන්න ඇති. අප්පච්චි වෙලා ඉන්න ඇති. ගුරුවරය වෙලා ඉන්න ඇති. සංසාරෙ ඒ තරමටම දිගයි. ඔහේ කැමතිද අම්මට අප්පච්චිට ගුරුවරයට අර විධියට කථා කරන්න. අඩුම වශයෙන් ඔහේ කැමතිද තමුන්ට ඔය විධියට අනුන් කථා කරනවට. නෑනේ! ඒ නිසා මතක තියා ගන්නව හොඳයි හැම සත්ත්වයෙකුටම එක සමාන විධියට ගරු කරන්න පුරුදු වෙනතුරු සංසාරෙන් ගොඩ වෙන එකත් හීනයක් තමයි කියල."

නාරොපා එවර කල්පනාවේ නිමග්න විය. දුර්ග මාවතේ සිටි භූතාත්මය තමන්ගේ පසු පසෙන් පන්නමින් ධර්මාවවාද දෙයි. තමන් දශක ගණනාවක්ම ප්‍රගුණ කළ ධර්ම ග්‍රන්ථවලින් ලද ආධ්‍යාත්මික අවබෝධයට වඩා වැඩි යමක් අද දවස තුළ ඉගෙන ගන්නට හැකිවී ඇත.

හේ සිතට ධෛර්යය ගෙන ඉක්මන් ගමනින් පා තබමින් තිලෝපා සොයා යන ගමන තව තවත් වේගවත් කළේය.

# 05

# වධක රස්සාවට ආරාධනයක්

කඳුයාය අනුක්‍රමයෙන් බෑවුම්ව පුළුල් මිටියාවතක් අසලින් අවසන් විය. ගංගාව පෙරට වඩා මහත්ව නිහඬව ගලා ගියේය. නාරොපා කඳුකරයෙන් නික්ම තරමක් උසැති පඳුරුවලින් ගැවසි බැදි පාරකට පිවිසියේය. පාරේ ඈත සිට ඔහු වෙත එන සුදු හැඳගත් මිනිසෙකි. ඔහු කිසියම් හදිසි කටයුත්තකට යන මැදිවියේ ගැමියෙකු බව පෙනෙන්නට තිබුණි. අමුත්තා වැඩි ගණනකට නොගෙන නාරොපා පසුකර යන්නට සැරසුණි.

"මේ ලොකු උන්නැහෙ. මට කියනවද තිලෝපා මුනිවරයගෙ අසපුවට යන පාර කෝකද කියල?"

"අපෙ හාමුරුදුරුවො පාර වරද්ද ගෙනනෙ. තිලෝපා මුනිවරයගෙ අසපුව තියෙන්නෙ අනික් පාරෙ. දැන් ඔය ආපු පාරෙම හුවක් විතර දුර ගිහිල්ල අතුරු පාරට හැරෙන්න. ඒ පාරෙන් ගියාම තිලෝපා මුනිවරයගෙ අසපුවට යන්න පුළුවන්."

නාරොපා ආපස්සට හැරී හූවක් හමාරක් දුර යන අතර වන මැද දක්වා දිවෙන අතුරු පාරක් දිස්විය. හේ ප්‍රධාන මාර්ගයෙන් මෑත්ව අතුරු පාර දිගේ තව තවත් ඈතට ගියේය. වනාන්තරය මැද විශාල පිට්ටනියක් විය. රතු පැහැ ඇඳුමක් හැඳ සිටින වධකයෙක් අතපය බැඳ දමා සිටින මිනිසුන්ගේ ගෙල කපමින් සිටියේය. නාරොපා කිසිදිනක එවැනි ත්‍රාසජනක සිද්ධියක් දැක තිබුණේ නැත. ගෙල සිඳින ලද මිනිසුන්ගේ කඳෙන් විදින රුධිර ධාරාවන් දුටු නාරොපා මහත් බියටත් අප්‍රසන්නතාවටත් පත්විය.

නාරොපා දුටු මතින් වධකයා ප්‍රීතියෙන් මොරදෙන්නට විය. හේ තම අත ඇති කඩුවේ ගෑවී තිබූ ලේ සරමෙන් පිසලමින් ඉදිරියට ආවේය.

"ඇති යාංතං. මට දැන් විවේකයක් ගන්න පුළුවන්."

"ඇයි මොකද එහෙම කිව්වෙ?"

නාරෝපා බියෙන් වෙවුලමින් වධකයාගෙන් ඇසීය.

"මුං ඔක්කොම අපරාධකාරයො. මුන් ඔක්කොම රජ්ජුරුවන්ගෙ වැරදි තැන තැන කතා කරපු අය. මුන් සේරම අල්ලල කැලේට අරං ගිහින් මරලා දාන්න රජ්ජුරුවො අණ කළා! රජ්ජුරුවො මට අණකළා මුන් ඔක්කොගෙම හිස ගසල දාන්න. මම වැඩේ ටිකක් දුරට කළා. ඒත් මට හරි මහන්සියි. ඔහේ දැන් මගේ වැඩේ පටන්ගෙන මුන්ගෙ හිස ගසල දානවා. නැතිනම් මම ඔහෙත් මෙන්න මේ විධියටම කණුවකට තියල ගැටගහල එකපාරෙන් හිස ගසල දානවා."

"තමුසෙ ඕයි හරි කතාවක්නෙ කියන්නෙ. මම කොහොමද ඔය පහත් වැඩේ කරන්නෙ. මම බ්‍රාහ්මණ වංශිකයෙක්. බ්‍රාහ්මණයො කවදාවත් වධක රස්සාව කරන්නෙ නෑ. වධක රස්සාව කරන්නෙ පහත්ම කුලේ අය. අනෙක මම බෞද්ධ භික්ෂුවක්. ආචාර්ය උපාධිධාරියෙක්. මම තමයි නාලන්දාවෙ පීඨාධිපති නාරෝපා."

"පුහ්! පීඨාධිපතියෙක් කඩුව ඇල්ලුවම කැපෙන්නෙ නැතුව යනවද? සිවුරක් ඇන්ද පළියට අතපය අවලංගු වෙනවද? බමුණු පවුලක උපන් පළියට කන්න බොන්න සේරම පිනට හම්බ වෙනවද? අනේ යනව ඕයි යන්න! තමුසෙගෙ උපාධි පට්ටම් තියා ගන්නව තමුන්ගෙ රස්සාව කරන තැනට! මේ කැලේට තමුන්ගෙ උපාධි පට්ටම්වලින් වැඩක් නෑ."

නාරෝපාට කෝපය නිම් හිම් නැතිවිය. හේ වධකයා අත තිබූ කඩුව දැක බියපත්ව මුවින් නොබැණ සියල්ල අසා සිටියේය. එවර වධකයා මහ හඬින් සිනාසෙන්නට විය.

"හා හා!. ඔහේ නම් හරිම පුත්තරයෙක් තමයි. දැන් ඔහෙට ඕන සත්‍යාවබෝධය ලබන්නනෙ. දැන් ඔහේ කුලමල භේද, උපාධි පට්ටම්, තනතුරු තාන්න මාන්න සේරමත් අරගෙනයි නිවනට යන්නෙ. ඒයි යාළුවා එකක් මතක තියා ගන්නවා. තමුසෙ නිවන් පුරට යනව නම් තාන්න මාන්න, උපාධි පට්ටම් සේරම නිවන් පුරේ දොරකඩ තියල හිස් අතින් තමයි එතැනට යන්න පුළුවන්. හහ්... හහ්... හා...!"

වධකයා සිනාවෙමින් සිටින අතර නාරොපා හිමින් සීරුවේ ඔහුගෙන් බේරී ගමනාරම්භ කළේය.

"තමුසෙ මගෙන් බේරුණාට කමක් නෑ! අපෙ මලයන්ඩිලා දෙන්න ඊළඟ වංගුවෙ ඉන්නවා." නාරොපා වධකයාගේ මොරදීම ගණනකට නොගෙන ලහි ලහියේම වනගත මාර්ගය තරණය කරන්නට විය. වධකයා කී දෙය සැබෑවකි. ඊළඟ වංගුවේ වධකයන් දෙදෙනෙකි. ඔවුහු මිනිසෙකු ජීවග්‍රහයෙන් අල්වාගෙන පණපිටින්ම උදරය පළා අතුණුබහන් එළියට අදිමින් සිටියහ. රජතුමා රටට බෝසත් චරිතයක් මවා පාමින් සිය දේශපාලන සතුරන් හොර රහසේම මරා දමන අධමයෙකු බව නාරොපා පසක් කර ගත්තේය.

නාරොපා දුටු වධකයෝ දෙදෙනාම ප්‍රීතියෙන් පිනායමින් කෑගසන්නට වූහ.

"තමුසෙ නම් හරිම වාසනාවන්තයෙක් ඕයි. හරියටම වෙලාවට නෙ මෙතනට ආවෙ."

"ඇයි මොකද?" නාරොපා බියෙන් වෙව්ලමින් පෙරළා ප්‍රශ්න කළේය.

"මේකා දරුණුම දරුණු ගණයේ අපරාධකාරයෙක්. මේ රටේ හැම අපරාධයක්ම කෙරෙන්නෙ මූගේ අනුදැනුම ඇතිව. අපි බොහොම අමාරුවෙන් මේකව අල්ලගෙන රජ්ජුරුවන්ට ඉදිරිපත් කළා. රජ්ජුරුවො අපිට කිව්වා පණපිටින්ම මූගේ බඩ පලලා බඩවැල් එළියට ඇදල කෑලිවලට කපල දාන්න කියල. දැන් අපි බඩවැල් එළියට ඇදල තියෙන්නෙ. ඔහේට ඉතුරුවෙලා තියෙන්නෙ පොඩි වැඩක් විතරයි. මේ මස් කපන පිහිය අරගෙන බඩවැල් මුලින්ම කපල දානවා!"

මෙවර හමුවූ වධකයන් දෙදෙනාගෙන් ගැලවීම පහසු නැත. නාරොපා බලවත් අප්‍රියෙන් යුතුව අලුතෙන් ලැබුණු වධක රස්සාව භාරගෙන වධයට ලක්වූ මිනිසාගේ අතුනු බහන් කපන්නට විය.

"තමුසෙ කොයි ඉස්කෝලෙටද ගියෙ? ඔහොමද බඩවැල් අයින් කරන්නෙ. තැනින් තැන කපන්නැතුව මුළු බඩවැලම එළියට ඇදල දාලා මුල හොයල කපල දානවා මෙන්න මේ විධියට." එක්

වධකයෙක් නාරොපාගෙන් පිහිය ඉල්ලාගෙන අසරණ මිනිසා කෑ මොර දෙමින් සිටියදීම ඔහුගේ අතුණුබහන් කපා ඉවත් කළේය.

"අපෝ ඇති යන්තම්..." කියමින් නාරොපා වධකයන්ගෙන් මෑත්ව නැවත ගමනාරම්භ කළේය. එවිටම වාගේ සුපුරුදු කටහඬ නැවතත් ඇසෙන්නට විය.

"යාළුවා සත්‍යාවබෝධය කියන්නෙ බඩවැල් කපනව වගේ දෙයක්. සසර ගමනෙ මුල තමයි තෘෂ්ණාව. විද්‍යාව කියන පිහියෙන් තෘෂ්ණාව කියන බඩවැල කපල ඉවත් කරන තුරු සංසාරය කියන අපරාධකාරයා මරන්න නම් ඉඩ ලැබෙන්නෙම නෑ. සසර ගමනට මුල සත්‍යය හරි හැටි නොදැනීමයි. අපි ලබන සංවේදනයන් තනිකරම මායාවක්. ඒක මායාවක් බව නොදැන ඒවට වටිනකම් දීල තෘෂ්ණාවෙන් වෙළුණම මොකද වෙන්නෙ. එතකොට සංසාර චක්‍රය එකදිගට කැරකෙනවා. සංසාර චක්‍රය නවත්තන්න ඕනෙනම් පළමුවෙන්ම මායාව හරියට අවබෝධ කරගන්න ඕන. අපි ලබන අත්දැකීම් හීන වගෙයි. මායාවක් වගේ. ඒ මායාකාරී ස්වභාවය හරිහැටි අවබෝධ කරගත්දාට ඔන්න ඉතින් තෘෂ්ණාව දුරුවෙනවා. තෘෂ්ණාව දුරුවුණ හැටියම මොකද වෙන්නෙ? ඇල්මක් බැඳීමක් නැති නිසා සසර ගමනත් එතැනින්ම අවසන් වෙනවා."

මෙවර උගත් ධර්ම කරුණු පෙර උගත් ඒවාට වඩා ගැඹුරුය. සසර ගමන කෙළවර කරන ආකාරය පිළිබඳ පැහැදිලි හෝඩුවාවන් එහි ඇතුළත්ය. නාරොපා වධකයන්ගේ උපමාව ගැන සිතමින් ඉදිරියට යන්නට විය. හූවක් දෙකක් ඉදිරියට යන විට අවාසනාවකට මෙන් තවත් වධකයෙක් ඔහුට හමුවිය. එවර දුටු වධකයා මිනිසෙකුගේ අතපය බැඳ නටන උණුවතුර හැලියක් ගෙන ඔහුගේ මුඛය තුළට වත්කරමින් සිටියේය. මිනිසා මොර දෙමින් නටන උණුවතුර පානය කර ලේ වමනය කරන්නට විය. ඔහුගේ අධෝමුඛයෙන්ද ලේ මිශ්‍ර උණුවතුර ඉවතට ගලා ගියේය. දැන් නාරොපාට වධකයන් හමුවීම තරමක් සාමාන්‍ය දෙයක් බවට පත් ව ඇත. හේ නොබියව වධකයා වෙත ගොස් තිලෝපා මුනිවරයා සිටින තැන ගැන විමසීය.

"තිලෝපා මුනිවරයද? එතුම ඉන්න තැන මම හොඳට දන්නවා. හැබැයි ඒ කොතනද කියල කියන්නෙ ඔහෙන් මට

උදව්වක් කළොත් විතරයි. උදව්වට උදව්ව. එහෙම නේද?"

"හොඳයි මගෙන් ඕන උදව්ව කියල ඉදිමුකො බලන්න."

"මම උණුවතුර හැලියට ගින්දර දාන්නම්. ඔහේ මේ කිණිස්ස අරගෙන ඒකෙන් වතුර අරන් මිනිහගෙ කට ඇරල දානවා හොඳට බඩ සුද්ද වෙල යනකං."

එවර නාරොපාගේ ඉවසීමේ සීමාව ඉක්මවා ගියේය. හේ තදබල කේන්තියෙන් යුතුව වධකයාට දෝෂාරෝපණය කරන්නට විය.

"ඔහෙල මට උණුවතුර පොවන එකක් ගැන කථාකරනවා. බඩ සුද්ධකරන එකක් ගැන කථා කරනවා. මම යන්නෙ සත්‍යාවබෝධයේ රහස් දැනගන්න. පිං අයිතිවෙයි. මට නම් ඔය පච්චාර වැඩ කරන්න අයිත් නම් කියන්නෙපා."

"යාළුවා, තමුසෙ පුදුම කෙනෙක්නෙ. තමන්ගෙ ඇතුළාන්තය පිරිසිදු කරගන්නෙ නැතුව සත්‍යාවබෝධය ලබන්නෙ කොහොමද? සත්‍යාවබෝධය ලබන්න උත්සාහ කරන අයගෙන් වැඩි දෙනෙකුට වරදින්නෙත් ඔතැනමයි. එයලා තමන්ගෙ ආධ්‍යාත්මය පිරිසිදු කරගන්න එක පැත්තක තියල අනුන්ට බණ කියනවා. තමන් හැදෙන්නෙ නෑ. ඒ නිසා මතක තියා ගන්නවා මේ පාඩම. ඉස්සෙල්ල තමන්ගෙ කුණුකන්දල් අයින් කරගන්න. ඊට පස්සෙ අනුන්ගෙ කුණුකන්දල් ගැන කතා කරන්න."

"හැබැට මේකා නම් පුදුම දාර්ශනික අදහස් තියෙන වධකයෙක්. ඒත් මට අල්ලන්නෙ නෑ මුගෙ පෙනුම. මුගෙ මූණ හරියටම අර කන්ද උඩ වක ගැහිල හිටිය බල්ලගෙ මූණ වගේ. නෑ නෑ. මූ හරියට අර ලාදුරු හැදිච්ච ගෑනිගෙ හැඩරුවමයි." මෙයාකාරයෙන් සිතමින් නාරොපා තුන්වන වධකයාගෙන්ද බේරී ඈතට ඈතට යන්නට ගියේය.

# 06

# වැරදි පාරක ගොස් අතරමංව

ආධ්‍යාත්මික ගුරු පහස සොයා යන ගමන මෙතරම් දුෂ්කර වේ යැයි නාරොපා කිසි දින නොසිතන්නට ඇත. හේ වනගත පෙදෙස පසුකර වාලුකා කතරක් මැදට පිවිසියේය. කාන්තාරයේ ටික දුරක් යනවිට ඈත ක්ෂිතිජය දෙසින් නගරයක් දිස්විය. සුවිසල් මන්දිර අතරින් ප්‍රාකාරයක් පැහැදිලිව පෙනෙන්නට වූ අතර ඊට ඉහළින් දර්ශනීය මාලිගාවක් පෙනෙන්නට විය.

"ඔන්න බලමු අපේ කාලෙ පොතපතවල අසම්පූර්ණකම. මේ වාලුකා කාන්තාරෙ මැද්දෙ රාජධානියක් තියෙනව කියල අද වෙනකං දැනගෙන හිටියෙ නෑ. කමක් නෑ. ගිහිල්ලම බලමු."

නගරයට ආසන්න වෙත්ම කඩිසරව එහෙ මෙහෙයන වෙළෙඳුන්ද විවිධ කාර්යයන් සඳහා නගරයෙන් බැහැරව යන නගරවාසීන්ද නාරොපාට හමුවිය.

"මේ ලොකු උන්නැහෙ. මට පොඩි උදව්වක් කරනවද?"

"මොකක්ද උදව්ව?"

"තිලෝපා මුනිවරයා ඉන්න ඉසව්ව මට කියනවද?"

"මම නම් ඒ හැටි දන්නෙ නෑ. ඒත් අර රජවාසලෙ ඉන්න රජතුමා හොඳ බෞද්ධයෙක්. මිනිස්සු කියන හැටියට නම් එයා තිලෝපා මුනිවරයගෙ හොඳ අනුගාමිකයෙක්."

නාරොපා දෙවරක් නොසිතාම රජවාසල මුරකාවලෙහි සිටි අයගෙන් අවසර ගෙන රජතුමා බැහැ දැකීමට ගියේය. රජතුමා එවෙලෙහි ස්වකීය මන්දිරයට වී ශෘංගාරාත්මක නර්තනයක් නරඹමින් සිටියේය. බෙරපද තාලයට ඉඟසුඟ නලවමින් ඉඟි බිඟි පාමින් නටන නළඟන දුටු නාරොපාට තමා ආ අරමුණ මොහොතකට අමතක විය.

"අර අතන දොරකඩ ඉන්න හාමුදුරුවන්ට එන්න කියමු බලන්න."

රාජපුරුෂයෝ රාජ අණ පිළිගෙන නාරොපා කැඳවාගෙන ගොස් රජු වෙත පමුණුවන ලදහ.

"මම නාලන්දා විශ්වවිද්‍යාලයේ බස්නාහිර පීඨාධිපති. මගේ නම නාරොපා. මම තිලෝපා මුනිවරයා සොයා යන ගමනෙ රජ මාලිගාවට ගොඩවැදුනෙ."

"හහ්... හහ්... හා... තිලෝපා මුනිවරයද? ඒ මගෙ ගජ මිත්‍රයානෙ. උන්දැ දැන් ඇති අර ඈත ගල් පර්වතේ තියෙන ගුහාවට වෙලා. එයා මේ දවස්වල ගැඹුරු භාවනාවක ඉන්නෙ. මට කිව්ව හැටියට තව සතියක් යනකල් ඒ විධියටම සමාධිගත වෙලයි ඉන්නෙ. මම කරන්නද පුංචි යෝජනාවක්. හාමුදුරුවො ඔය ගමන නවත්තල අපේ රජ මාලිගාවෙම නවතිමු. පැවිද්දෙකුට වුණත් මෙතන කැමති විධියට සැප විඳින්න පුළුවන්. කවුරු හරි විවේචනය කරන්න ආවොත් මට නිකං මතක් කරන්න. ඉතුරු ටික මං බලාගන්නං!"

රජුගේ ආගන්තුක සත්කාර විඳිමින් මාලිගයේම ජීවත්වීමට නාරොපා එකඟ විය. ඔහුට දින කිහිපයකට පසු ගුරුවරයා පිළිබඳ ඉලක්කය අමතක විය. රජ මාලිගාවේ පිසූ රසමුසු භෝජන බුදිමින් දිනපතා බණ කීමද ආගමික වතාවත් කිරීමද ඔහුට අයත් කාර්යය විය. සති කිහිපයක් යන විට නාරොපා කම්මැලිකමට කකා හිඳ පුස් ඌරෙකු මෙන් මහත්විය.

"අපේ හාමුදුරුවන්ට නොකියම බැරි රහසක් තියෙනවා."

"කියමුකො බලන්න."

"මගේ වැඩිමල් දූ කුමාරිකාව හරිම ලස්සනයි. ඒත් ඈ හරිම හිතුවක්කාරයි. එයා ඊයෙ හාමුදුරුවොන්ගෙන් බණ අහල ගොඩක්ම පැහැදිලා."

"එයත් මහණ වෙන්න ඕන කියනවද?"

"නෑ... නෑ... එයා කියනව හාමුදුරුවොම තමයි කසාද බඳින්න ඕන කියල. හාමුදුරුවො කසාද බැඳගන්න බැරිවුණොත්

මාලිගාවෙ ප්‍රාකාරයෙන් පැනල මැරෙවයි කියළමයි ඈ කියන්නෙ."

නාරොපා එකවර පිළිතුරක් නොදී කල්පනාවේ නිමග්න විය. තමන්ගේ ප්‍රිය බිරිඳ වන සංග්මෝ හා සසඳා බලන කල රජතුමාගේ දූ කුමරිය රූ රැජිනකි. ඒත් පැවිද්දෙකු වන තමාට කසාද බැඳීම කිසිසේත් නොකළ හැකි දෙයකි. පැවිද්දෙක් ස්ත්‍රී සේවනයේ යෙදුණොත් පාරාජිකා ඇවත සිදුවෙයි. නාරොපා එවර දැඩි ප්‍රතිපත්තියකට පිවිසියේය.

"මට කියටවත් බෑ. ඒ යෝජනාවට එකඟ වෙන්න. මම පැවිද්දෙක්. පැවිද්දෙකුට ස්ත්‍රී සේවනයේ යෙදෙන්න තහනම්. ඒ විනය නීතිය කඩකළොත් පාරාජිකා වෙනවමයි. මට බෑ සිල් බිඳගෙන අපායෙ උපදින්න."

"හහ්... එහෙමද! එහෙනම් බලමු. රාජපුරුෂය! වහාම හොඳ මහත වේවලක් ගෙන එව!"

රාජපුරුෂයා ගබඩාවට දිවගොස් තම්බොටු වැල් තම්බා තනන ලද හොඳ සවිමත් වේවැලක් ගෙන ආවේය. රජු ව්‍යාඝ්‍රයෙකු මෙන් නාරොපා වෙත කඩා පැන වේවැලෙන් තලාගෙන තලාගෙන ගියේය.

නාරොපාට වේදනාව ඉවසුම් නැතිවිය. හේ වේදනාවෙන් පීඩිතව කල්පනාවෙහි නිමග්න විය.

"හහ්... රජ්ජුරුවො දන්නෙ නැතුව ඇති මගෙ තරම. භාවනාවෙන් හොඳ කරන්න පුළුවන් වගේම භාවනාව නරකට යොදන්නත් පුළුවන්." හේ භාවනාවේ බලයෙන් රජුට පාඩමක් උගන්වනු පිණිස දෑස් පියාගෙන චක්‍ර සංවර නම් අධිබලැති භාවනාව කළේය.

හිත සමාධිගත වූ පසු නාරොපා නැවත සමාධියෙන් මිදී රජු ළඟපාත සිටින්නේ දැයි බැලීය. විස්මයකි. රජු පේනතෙක් මානයක නැත. මාලිගාව ද එහි සිටි සේවක කාරකාදීන් ද අතුරුදන්ව ඇත. නාරොපා වාලුකා කතරෙහි තට්ට තනියම එරමිණියා ගොතාගෙන සිටියේය.

"හෝ මෙතන හිටපු මිනිස්සු කෝ..!කෝ මෙතන තිබුණු මාලිගාව!" නාරොපා කෑ මොර දෙමින් කාන්තාරය මැදින් ගමන් කරන්නට විය. වැලිකතර මැදින් යන අතර ඔහුට එඩේරෙකු මුණ ගැසුණි.

"හරි වැඩේනෙ වුණේ. අර ඈත තිබුණු මාලිගාවයි නගරයයි දෙකම එක මොහොතකින් අතුරුදන් වුණා."

"මට හිතෙන්නෙ හාමුදුරුවො කාන්තාරෙ මැද්දි නින්දෙ ගිහින් හීනයක් දකින්නැති. නැතිනම් මෙහෙ කොයින්ද මාලිගාවක්. මෙතැන ඉඳගෙන ගව්ගාණක් දුරට තියෙන්නෙ කාන්තාරෙ. මනුස්ස පුළුටක්වත් මෙහෙ නෑ."

නාරොපා කල්පනාවෙහි නිමග්න වෙමින් වාලුකා කතර මැදින් ඈතට ඈතට යන්නට විය. "ඔහෝ මට දැනුයි මතක් වෙන්නෙ. අර කලින් දැකපු වධකයො දෙන්නගෙ මූණමනෙ රජ්ජුරුවොන්ට තිබුණෙත්. ඇයි දෙවියනේ මේව මටම වෙන්නෙ." මෙයාකාර සිතුවිලි දාමයක ගිලුණු නාරොපා කාන්තාරය තරණය කරන අතර සුපුරුදු කටහඬ එවර තරමක් ඈතින් ඇහෙන්නට විය.

"ඔහේට මතක ඇතිනෙ කලින් පාඩම. ජීවිතයෙ අපි දකින අත්දැකීම් මායාවන් වගේ. අපි විඳින සැප ඇත්තට තියෙන දේ නොවේ. ඒවා සියල්ල මායාවන් විතරයි. මායාවන් හැබෑවක් කියල හිතාගෙන වැඩකරාම අන්තිමට තමුන්ට වෙන්නෙ සංසාරය කියන කාන්තාරෙ අතරමං වෙන්න. දැන් මතක් කරගන්නවා තමුන්ට වැරදිච්ච තැන්. රජවාසලෙ නැටුම් දකින කොට ලස්සන ලස්සන කුමාරිකාවො දකිනකොට තමුන්ගෙ රාගය ඇවිස්සුනා නේද? රාගය ඇවිස්සෙන තුරු ඒ දුර්ගුණ තමන් ගාව නෑ කියල නේද හිතාන උන්නෙ. රජ්ජුරුවො වේවැලෙන් තලන කොට කේන්ති ගියා නේද? ඒ වෙනකල්ම තමුන් රටට පෙන්නගෙන හිටියෙ සාන්තුවරයෙක් කියල නේද? හහ්... හහ්... හා...! ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ කියන්නෙ ඔන්න ඕකටයි."

ඒ කටහඬෙන් කියවුණු උපදෙස්වල ගැඹුර තේරුම් ගත් නාරොපා ස්වයං විවේචනයක නිරත විය.

"ඇත්තම තේන්නම් මම හිතං හිටියෙ මට රාගය උපදින්නෙ නෑ. කාමාශාවක් උපදින්නෙම නෑ කියල. මම හිතාන උන්නෙ මට කේන්ති යන්නෙම නෑ කියල. මට දැන් තේරෙනවා. මේ කෙලෙස් දූවිලි පේන්න තියෙන දේවල් නෙවෙයි. ඒවා හිත පතුලෙ සැඟවිලා තිබිලා හේතු ප්‍රත්‍යයන් මත ඇවිස්සිලා උඩට මතුවෙනවා. අපි කවදාවත් ඉක්මන් වෙන්න නරකයි අපි කෙළෙස් දුරුකළා කියල කියන්න."

කාන්තාර ප්‍රදේශය පසුකළ පසු නාරෝපා අතරින් පතර උස ගස් ඇති තණ බිමකට පිවිසියේය. තණබිමෙහි එක්තැනක තිබූ රූස්ස ගසක් ළඟ දුන්නක් මානාගත් මිනිසෙක් හෙමින් සීරුවේ පා තබමින් ඉදිරියට යමින් යනු දුටු නාරොපා ඔහු වෙත ළං විය. ගෝන සමින් කළ මල්ලක් ඔහුගේ උර මත තිබූ අතර දෙපායේ ලූ පාවහන්ද සමෙන්ම නිමවූ ඒවාවිය. ඒනම් හැබෑම දඩයක්කාරයෙකි.

"අනේ මේ පොඩියක් නැවතිල කියන්නකො තිලෝපාතුමා ඉන්නෙ කොහේද කියල?"

"ෂත්! ගෝන පැනල දිව්වනෙ! අර බලනවකො ඕයි. තමුසෙගෙ කෑ ගැහිල්ලට මෙතන හිටිය ගෝන පැනල දිව්වනෙ."

දඩයක්කාරයා කී දේ සැබෑවකි. වියළි කොළ පයට පෑගී සරබර ගාන සද්දයට බියේ ටික දුරක් දිව ගිය ගෝනා යාර සීයක් විතර ඈතට වන්නට කන් යොමාගෙන විමසිල්ලෙන් පසුවිය.

"ඔහේ මගේ දඩයම වැරැද්දුවනෙ. දැන් ඉතින් මගේ යකා අවුස්සන්නැතුව මේ දුන්නට ඊය දාල ඉලක්කෙ අරගෙන ගෝනට විදිනවා."

"තමුසෙට පිස්සුද ඕයි. අපි හාමුදුරුවරු. අපට දුනුවලින් විදල පුරුදු නෑ!." නාරොපා දඩයක්කාරයාට සැරවිය.

"ඔය තරම් කේන්තිගන්න හොඳ නෑ. මට ඕන ඔහේට පාඩමක් උගන්නන්න. ඔහේගෙ මනස දුන්නට සමාන කරන්න. විදර්ශනා ඥානයත් ඊතලයට සමාන කරන්න. ඔහේගෙ හිත තුළ තියෙන මමත්වය මෙතනින් දුවපු ගෝනට සමාන කරන්න. වෙර වීරිය කරල දුන්නට ඊය දාල ගෝනට විදින්න කිව්වේ ඔය අර්ථය

ඇතිව. මනස යොදවලා විදර්ශනා ඥානවලින් ඉලක්කය අරගෙන මානය නැතිනම් මමත්වය පසාරු කර හරින්න. ඒ මොහොතේම සත්‍යාවබෝධය ලැබෙනවා. ඒක සිකුරුයි." දඩයක්කාරයාගේ බණවාරය තවම නිමාවට පත්ව නැත. ඔහු නාරොපාට දිගින් දිගටම බණ කියයි.

"මට පේන්නෙ ඔහේ තිලෝපා කියන ගුරුවරයා තමයි හමුවෙන්න යන්නෙ."

"ඔව්... ඔව්... මට ඕන තිලෝපා හමුවෙන්න තමයි."

"ඒ කියන්නෙ මසින් ලෙයින් තැනුණු ගුරුවරයෙක් හමුවෙන්නයි යන්නෙ."

"මස් ලේ නැති ගුරුවරු ඉන්නෙ කොයි රටේද?"

"නෑ යාළුවා. ගුරුවරයා හමුවීම කියන්නෙ වෙන තේරුමක් තියන දෙයකට. තමන්ගේ චිත්ත සන්තානය තුළ තියෙන විචිකිච්ඡාව එහෙම නැතිනම් සැකය නිසානෙ ගුරුවරයෙක් හමුවෙන්න යන්නෙ."

"ඔව්. ඒක හරි."

"එහෙනම් ගුරුවරයා හමුවීම කියන්නෙ විචිකිච්ඡාව නැතිනම් සැකය දුරුවීමට. මම හරිද?"

නාරොපා කල්පනාවෙහි නිමග්න විය. දඩයක්කාරයා කියන දෙය තුළ අති දැවැන්ත දාර්ශනික සත්‍යයක් ගැබ්ව ඇත. සැකය දුරු නොවේ නම් මසින් ලෙයින් තැනුනු ගුරුවරුන් දහසක් හමු වුවද පලක් නැත. සැකය දුරුවේ නම් එතැනදී ගුරුවරයා හමුවී ඇත. මෙතරම් වටිනා දාර්ශනික අදහසක් මට නාලන්දාවේදීවත් දැනගන්නට ලැබුණේ නෑ නේද? යනුවෙන් සිතමින් නාරොපා දඩයක්කාරයාගෙන් සමුගෙන ඉදිරියටම යන්න ගියේය.

"මදැයි මටත් වුණ දෙයක්. නාලන්දාවෙ පීඨාධිපති වෙච්චි මට මස් වැද්දන්ගෙන් බණ අහන්නත් වුණා. අන්තිමේදී තව මොනව මොනව වෙයිද දන්නෙ නෑ." සිතුවිලි සයුරක කිමිදෙමින් ගමන් කළ නාරොපා බැදි පාරකට පිවිසියේය.

බැදිපාර තුළ මගදුරක් යද්දී රාත්‍රිය උදාවිය. ඈත කැලයේ ව්‍යාඝ්‍රයන් කෑගහන හඬ රැහැයි හඬ පරදවමින් පැහැදිලිව ඇසෙන්නට විය. ඔහුගේ සිතට තනිකමක්ද බියක්ද දැනුනි.

වනාන්තරය මැද හේනක් අද්දර කුඩා පැල්පතක් පෙනෙන්නට විය. පැල්පතට කිට්ටු කළ නාරෝපා දෙතුන් විටක් කාරා කටහඬ අවධිකළේය. අවුරුදු අසූවක් පමණ වයස ඇති මහල්ලෙක් ලාම්පුවක්ද රැගෙන පැල්පතේ දොර විවර කළේය.

"මයෙ අප්පේ හාමුදුරුනමක් තට්ට තනියම මේ රෑ?"

"මම තිලෝපා මුනිවරයා හමුවෙන්න යන ගමන්. කැලේටම රෑ වුණා."

"කමක් නෑ. අද රෑ අපේ පැලේම ඉන්න පුළුවන්. අපි ආගන්තුක සත්කාරයට බොහොම ලැදි අය. මමයි මගේ මායියයි විතරයි දැන් මෙහෙ ඉන්නෙ."

මහල්ලාගේ ඉල්ලීම පිළිගෙන නාරෝපා දුගී පැලේ නවාතැන් ගත්තේය.

"යෝදියෙ අපි හාමුදුරුවොන්ට දෙන්න සුප් එකක් හදමු."

මැහැල්ල තම ස්වාමිපුරුෂයාගේ කීමට එකඟව වතුර හැලියක් ලිප තැබුවාය. වතුර හැලිය නටා ගෙන එන විට මූඩි පියනකින් වසා තිබූ කොරහක් විවර කළ මැහැල්ල එහි සිටි මාළුන් සහ මැඩියන් පණ ගසමින් දඟලද්දී වතුර හැලියට දැම්මාය. නාරෝපා ඒ සිදුවීම දෙස පිළිකුළෙන් යුතුව බලා සිටියේය.

"හා දැන් අපෙ හාමුදරුවොන්ට ඉස්ඉස්සෙලම දානෙ ටික බෙදල ඉඳිමු."

නාරෝපා තම පාත්‍රය මුවාකොට ආහාර පිළිගැනීම ප්‍රතික්ෂේප කළේය.

"මම පැවිද්දෙක්. රෑට දන් වළඳන්න මට අකැපයි. ඇරත් මම මස්, මාළු වළඳන්නෙ නෑ. තමන් වෙනුවෙන් මරපු මස්මාංශ වළඳන්න පැවිද්දන්ට අවසර නෑ."

ඒ ඇසූ මහල්ලා සුප් බඳුන ඉවතට වීසිකළේය. සුප් බඳුන ඉවතට වීසි කිරීමත් සමඟ ඈත අහසේ දේදුනු පැහැති රටාවල් පෙනුනි. මහල්ලා නැවත දෙඩමළු වූයේය.

"අපේ හාමුදුරුවනේ. අපිට වැරදිච්ච එක තැනක් තමයි ඔතැන. හාමුදුරුවරු ගොඩක් වෙලාවට හිතනවා අපි හරිම සිල්වත්. අපි හරිම ධූතාංගධාරී. ඒනිසා අපිට නිවන් සැප ලැබේවි කියල. එහෙම වෙන්නෙ නෑ. සීලය කියන්නෙ පදනම විතරයි. සීලය කියන පදනම උඩ තමයි සමාධි ප්‍රඥා කියන දෙක වඩල සත්‍යාවබෝධය ලබන්න ඕන. එහෙම නැතිව මම හරි සිල්වතා කිය කිය හිටිය කියල සසර දුකෙන් එතෙර වෙන්න බෑ." මහල්ලාගේ ධර්ම දේශනය ඇසූ නාරොපා තිලෝපා හමුවට යන ගමනේදී හමුවූ අද්භූත දේ ගැන විස්තර කළේය.

"අපෙ හාමුදුරුවො තවම දන්නෙ නෑ ඉදිරියට මොන මොන දේ වෙයිද කියල. මතක තියාගන්න. සත්‍යාවබෝධය ලබන්න නම් අම්මයි තාත්තයි මරන්නම වෙනවා.

"මක් කිව්වා? අම්ම තාත්ත මරන්න. මට බෑ ආනන්තරිය පාපකර්ම කරලා අපායෙ කල්ප ගාණක් විඳවන්න. ඊට වැඩිය හොඳයි මම ආපහු හැරිල නාලන්දාවටම යනවා."

"හා හා කලබල වෙන්න කාරි නෑ. හෙට ලැබෙන අත්දැකීම් බලලම තවදුරටත් දැනුම් තේරුම් ඇතුව තීරණයක් ගත්තොත් හොඳයි."

නාරොපා මහල්ලාගේ නිවසෙහි රාත්‍රිය ගතකළේය. උදෑසනම ඒ දෙපළගෙන් සමුගෙන ආධ්‍යාත්මික ගුරුවරයා සොයා යන ගමන නැවත ආරම්භ කිරීමට අදිටන් කර රාත්‍රියේ නින්දට ගියේය. පසුදින උදෑසන ඔහු අවදි වූයේ කුරුල්ලන්ගේ කිචිබිචියත් සමඟය. ඒ වන විට මහල්ලා සහ ඔහුගේ නිවස අතුරුදන්ව තිබුණි. තමන් වනමැද තිබූ පාලු මුඩුබිමක වැතිර සිටින බව නාරොපාට වැටහුණි. හේ උදෑසනින්ම එතැනින් පිටත්වූයේ තව තව අද්භූත සිද්ධීන් කීයක් සිදුවේදැයි තමාගෙන්ම ප්‍රශ්න කරමිනි.

# 07

# හොඳ හොඳ සෙල්ලම් එළිවෙන ජාමෙට

නාරොපා පාන්දරම පාලු බිම්කඩෙන් ඉවත්ව වන බිම මැදින් ගමනාරම්භ කළේය. ඔහුට වැඩිදුරක් යන්නට ලැබුණේ නැත. වනපෙත සිසාරා යන අඳෝනාවක් ඉදිරියෙන් ඇසේ.

"අපිව බේරාගන්න කවුරුත් නැද්දෝ! අයියෝ මෙන්න මිනීමරණවෝ!"

නාරොපා ලහි ලහියේ දුවගොස් අඳෝනාව ඇසුණු තැනට ළංවිය. ඔහු එතැනට ළංවන විටම තම මාපියන් පල්හොරුන්ගේ ග්‍රහණයට ලක්ව සිටින අයුරු දිස්විය. පල්හොරු මාපිය දෙදෙනා රැහැන්වලින් බැඳ මරා දමන්නට ලැහැස්තිව සිටියහ.

"අපි කැලේ මැදින් යද්දි පල්හොරුන්ට කොටුවුණා මයෙ පුතේ! අපි ළඟ කණකර බඩු නැතැයි කියල දැන් අපව මරන්නයි හදන්නෙ. අපිව දැන්ම මරල දාවි මයෙ පුතේ. උඹවත් මෙතැනින් විජහට බේරිල පලයන්." දෙමාපියෝ නාරොපා දුටු තැන අඳෝනාව නවත්වා ඔහුට එතැනින් ඉවත් වන ලෙස බැගෑපත් වූහ. ඒ හා සමඟම නාරොපා පල්හොරුන්ගේ ග්‍රහණයට ලක්විය.

"හොරගෙඩිය වගේ බලාන ඉන්න හැටි. අපිට මේ වැඩේට උදව් කරනවකො."

"මොන වැඩේටද?"

"තමුසෙ මේ කිණිස්ස අරගෙන නාකි ගෑනිගෙයි, මිනිහගෙයි පපුව මැදට ඇනල මරල දානව අපිට පව් පුරවන්නෙ නැතුව!"

"මගෙ අම්ම අප්ප මරන්න අතක් උස්සන්නෙ කොහොමද? දෙමව්පියන් මරන එක ආනන්තරීය පාප කර්මයක්. මට බෑ ඒව කරන්න."

ඒ හා සමගම සොර මුල තරමක් මෙල්ල වූ බව පෙනුනි.

"කවුද කිව්වෙ ආනන්තරිය පාප කර්ම කරන්න කියල. අපි කිව්වෙ මමත්වයත් ඒ හා බැඳුනු ආකල්පත් බිඳල දාන්න කියල. මව පියා සහෝදර සහෝදරියන් මේ සේරම මමත්වය එක්ක බැඳුනු ආකල්පයන්. මේ ආකල්පයන් හිස උඩ තියාගෙන සත්‍යාවබෝධයට යන්න තියා හිතන්නවත් බෑ."

සොරමුලේ නායකයා බණ කියමින් සිටින අතර මව හා පියා අතුරුදන්ව සිටියහ.

08

# නාරොපා පුල්ලහාරියට පැමිණෙයි.

මව හා පියා හමුවීමේ සිද්ධියෙන් පසු නාරොපා වනාන්තර ගිරිදුර්ග තරණය කර පුල්ලහාරියට පැමිණ සිටියේය. ඔහු තිලෝපා මුනිවරයා සිටින තැන සොයා තැන තැන ගිය නමුත් ඒ නම ඇසුවෙක්වත් නොමැතිවිය.

"අන්න අර පන්සලේ ඉන්න හාමුදුරුවන්ගෙන්වත් අහල බැලුවනං." එකෙක් යෝජනා කළේය.

නාරොපා පන්සලට ඇතුළුවී එහි එහි විහාරාධිපති තැන හමුවිය. විහාරාධිපති හිමිනම සිංහාසනයක් වැනි වූ පුටුවක හිඳගෙන මැණික් අල්ලන ලද වටාපතක් ද අතැතිව අල්පේච්ඡතාවයේ වටිනාකම ගැන ගෝල පිරිසට බණ කියමින් සිටියේය.

හේ බණ දේශනාව අවසාන වන තුරු හිඳ කටහඬ අවධි කළේය.

"මම නාරොපා. නාලන්දාවෙ ඉඳලයි එන්නෙ."

"ආපු කාරණාව කියමුකො බලන්න."

"මට ආරංචියි සත්‍යාවබෝධය ලබපු මුනිවරයෙක් මෙ කිට්ටුව පාත ඉන්නව කියල."

"ඒ මොන විකාර කතාවක්ද? අපට නොදැනි සත්‍යාවබෝධය ලබන්න. තුන් පිටකෙම පොත් තියෙන්නෙ අපි ළඟයි. මේ පැත්තෙ යමෙක් බණ භාවනා කරනව නම් අපිට නොදැනි ඔය හැටි දියුණු තියුණු වෙන්න විධියක් නෑ."

"ඒක වෙන්න පුළුවන්. මට දැනගන්න ඕන තිලෝපා කියල තාපසයෙක් ඉන්නවද කියල."

"තිලෝපා කියල තාපසයෙක් ගැන නම් අපි අහල නෑ. ඒත් තිලෝ කියල පිස්සු හිඟන්නෙක් මේ පැත්තෙ ඉන්නවා. මිනිස්සු කියන හැටියට එයා කලින් රජකෙනෙක් හැටියට ජීවත් වෙලා ඉඳල තියෙන්නෙ. පස්සෙ මිනිහ හොඳටම පිස්සු වැටිල. උන්දෑ කාලයක් වල් ගෑනියෙකුගෙ ගෙදර පදිංචි වෙලා උන්න කියලත් ආරංචියි. ඒ මදිවට වල් ගෑනිගෙ ළමයි සේරම උන්දැට තාත්ත කියල කතා කරන්න පටන් අරන්. ඔන්න දැන් පාරට වැටිල හිඟා කනව. පව් අහිංසකයා."

තිලෝපා යන නමින් යුතු මුනිවරයෙකු ගැන දන්නා කෙනෙකු මුළු පුල්ලහාරියේම නැත. එනමුත් තිලෝ නමින් හැඳින්වෙන හිඟන්නෙකු ගැන පමණක් හෝඩුවාවක් ඇත. බලාපොරොත්තු සුන් වේදැයි නොවේදැයි දෙගිඩියාවක සිටි නාරොපා තිලෝ නමින් හැඳින්වෙන හිඟන්නා සොයමින් අගුපිල් පීරන්නට විය.

මේ අතර එක් පාලු පෙදෙසකදී ගිනිමැළයක් අසල සිටින හිඟන්නෙකු නාරොපාට දිස්විය. හිඟන්නා කන්නට යමක් නොමැති තැන මැඩියෙකු පණපිටින් රිටක ඇණ ගින්නෙහි ලා පුළුස්සමින් සිටියේය. මැඩියා වේදනාවෙන් පෙළෙමින් ඒ මේ අත දඟලන්නට විය.

නාරොපා අප්‍රසන්නතාව මැඩගෙන හිඟන්නා වෙත ළං විය.

"ඔබතුමාද තිලෝපා මුනිවරයා?" හිඟන්නා හිස සලා එය අනුමත කළේය. නාරොපාට පසුගිය දිනවල මුහුණපෑ ජවනිකා එකින් එක මතක් විය. නාලන්දාවට ආ අවලස්සන ස්ත්‍රිය, මඟදී හමුවූ ලාදුරු රෝගී කාන්තාව, වධකයන්, මහල්ලා, අඩයක්කරු ඒ සියලුදෙනාගේම මුහුණුවර හිඟන්නාගේ මුහුණට සමාන විය.

නාරොපා යටහත් පහත්ව හිඟන්නා වෙත ළංවිය.

"මම කැමතියි ඔබතුමාගෙ ශිෂ්‍යයෙක් විධියට ඉඳලා සත්‍යාවබෝධය ලබන්න." හේ බැගෑපත්ව ඉල්ලා සිටියේය.

"ඒත් ඒක තමුන් හිතන තරම් ලේසිත් නෑ. අමාරුමත් නෑ. දැන් බලනවකො මගේ ඇගේ කිනිතුල්ලොත් වහල. ගණන්

කරල බලනවකො. මගේ ඇඟ පුරා කිනිතුල්ලො පනස් එක් දෙනෙක්. උන් උදේ හවා ලේ උරා බොනවා. ඔහේ මෙතන ඇවිත් සත්‍යාවබෝධය ගැන කථා කරනවා. ඔක්කොටම ඉස්සෙල්ලා කිනිතුල්ලො පනස් එක් දෙනා ගලවලා ගිනිමැලේට දානවා."

"හාපෝ! මම ඒක කරන්නෙ කොහොමද? මම කෝටියක් සංවර සීලය රකින කෙනෙක්. මට සත්තු මරල පව් පුරවගන්න නම් බෑ."

"කවුද තමුන්ට කිව්වෙ සත්තු මරන්න කියල. මම කිනිතුල්ලන්ට උපමා කළේ කෙලෙස්. සත්‍යවබෝධය වළක්වන කෙලෙස් පනස් එකක් තියෙනවා. ඒ කෙලෙස් කිනිතුල්ලන් වගේ. තමන්ගේ වැරදිවලින්මයි කෙලෙස් කියන කිනිතුල්ලන් පෝෂණය වෙන්නෙ. මම කිනිතුල්ලන් ගලවන්න කිව්වේ කෙලෙසුන්ගෙන් මිදෙන්න කියල."

කෙටි ධර්ම දේශනාව අවසානයේ හිඟන්නා අතුරුදන් විය. ගුරුවරයා ළඟට පැමිණි පසු අතුරුදන්වීම ගැන නාරොපා දැඩි කනස්සලට පත්විය.

සති ගණනාවක්ම එක දිගට ඇවිදීමෙන් විඩාවට පත් නාරොපා පුල්ලහාරියේ ගල් තලාවකට වී ගිමන් හරින්නට විය. ඒ හා සමඟ ඔහු ඉදිරියේ විකාර රූප පෙළක් පෙනෙන්නට විය. දිවක් නැති මිනිසෙක් කථාවක් පවත්වන්නට විය. බිහිරෙක් එය ඕනෑකමින් අසා සිටියේය. පාද නොමැති කොර මිනිස්සු තැන තැන දුවන්නට වූහ. හිසසුන් මළ සිරුරු තැන තැන ඇවිදින්නට විය. ඒ අද්භූත දර්ශන පෙනෙන අතර තිලෝපාගේ කටහඬ පැහැදිලිව ඇසෙන්නට විය.

"දරුව ලෝකය මිරිඟුවක් වැනිය. මිරිඟුවක් වැනි ලෝකය යථාර්ථයක් ලෙස සිතනතාක් දුර සත්‍යාවබෝධය ඔබට අකැපය. ඔබ මේ තාක් දුර පැමිණියේ ඇටලේ මස්වලින් සැදුණු ගුරුවරයෙකු සොයාගෙනය. නියම ගුරුවරයා ඔහු නොවේ. නියම ගුරුවරයා යනු නිසල කළ මනසයි. නිසල මනස තුළින් ඔබම ඔබගේ යථා ස්වරූපය වටහා ගත යුතුය. එයයි නියම සත්‍යාවබෝධය. මනස පාද රහිත මිනිසෙකුට උපමා කර ඇත. මනස දුර ගමන්

යන්නේ පාද රහිත මිනිසෙකු එහෙ මෙහෙ යන්නාක් මෙනි. සිහිවිලි පැන නගින මුත් ඒවා පැන නගින්නේ කොයි සිටදැයි කිව නොහැකිය. හිස නැති මිනිසුන් රඟන ලෙස සිතුවිලි ධාරාව ගලා යයි. සත්‍යාවබෝධයට පැමිණීම යනු මනසෙහි යථා ස්වරූපය දැන මනසක් එය මගින් අරමුණු කරන දෙයත් යන දෙකම කෙරෙහි ඇල්ම දුරුකර ගැනීමයි."

ඒ උපදෙස් කිහිපය ලැබීමත් සමඟ සියල්ල නිහඬතාවයට එක්විය. නාරොපා පුල්ලහාරියේ ගල් තලාවක් මත තනිවිය. තිලෝපා මුනිවරයා කොහි ගියාද කියා කියන්නට නොහැකි විය. තනිකම, කාන්සිය, මහන්සිය, කළකිරීම ඒ සියල්ල උත්සන්නව පිටාර මට්ටම දක්වා නැගී සිටියේය. නාරොපා සියදිවි හානි කර ගැනීමට තීරණය කළේය. හේ තම ඔලොගුවෙන් දැළි පිහියක් එළියට ගෙන ගෙල සිඳගෙන මියයන්නට සැරසුණේය.

"හා... හා... මැරෙන්න නම් එපා. මැරෙන්න තව කල් තියෙනවා. ඒ වගේම මැරෙන්න කලින් තව ගොඩක් වැඩ කරන්න තියෙනවා. ඔහේ ඔය විධියට මැරිල ගියාම මගේ ඉගැන්වීම් ලෝකෙට බෙදා හරින්නෙ කවුද?"

රතුවන් ඇස් ඇති කළු කෙට්ටු සිරුරක් ඇති මිනිසෙක් කෑගසමින් ඉදිරියට පැමිණ නාරොපාගේ දෑත් අල්ලා ගත්තේය.

"ඔබතුමා මෙච්චර වෙලා කොහේද හිටියෙ?"

"මම එදා නාලන්දාවෙදි හමුවුණ දවසෙ ඉඳලම නුඹ ගාවමයි හිටියෙ!"

"නාලන්දාවෙදි හමුවුණා කිව්වා?"

"ඔහේට මතකයිනෙ නාලන්දාවෙදි හමුවුණු අවලස්සන ගෑනු කෙනා?"

"මම තමයි ඒ චරිතෙ රඟපෑවෙ! මොකද කන්න වගෙ මගේ දිහා බලන් ඉන්නෙ. පහුගිය දවස් ටිකේම ඔහේ හමුවෙන්න ආවෙ මම තමයි. එතකොට අර හොරිකඩ බල්ලා. දඩයක්කාරයා. මහල්ලා. ඒ චරිත සේරම රඟපෑවෙ මම තමයි. හහ් හහ් හා...!"

තිලෝපා කොක්හඬලා සිනාසෙන්නට විය.

"එහෙනම් මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්නම්. ඔබතුමා ඇයි මට කෙළින් මුහුණ නොදී වසන්වෙලා උන්නෙ."

"මම වසන් වුණේ නෑ. පෘතග්ජන මනස විසින් නුඹවම මුලා කරනු ලැබුවා. ඒකයි නුඹට නියම ගුරුවරයා දකින්න අපහසු වුණේ."

# 09

# ගුරු ඇසුරෙහි ජීවිතය

නාරොපා තම අසපුවට කැඳවා ගෙන ගිය තිලෝපා පලවැල නෙළාගෙන විත් ඔහුට සංග්‍රහ කළේය. තමන් උපන්තෙකට නොදුටු රසවත් පලතුරු දුටු නාරොපාට කුතුහලයක් ඇතිවිය.

"මේ ගෙඩි ජාතිය වැල්වල හැදෙන ඒවද නැතිනම් ගස්වල හැදෙන ඒවද?"

"කොහේ හැදුනම මොකද බඩගින්න නිවෙනවනම්."

එසේ කියූ තිලෝපා නාරොපාගේ දුර්වල වූ ශරීරය ප්‍රකෘතිමත් කිරීමට අවශ්‍ය බේත් හේත් සියල්ල නොඅඩුව ලබා දුන්නේය.

තිලෝපා අමුතුම තාලයේ ගුරුවරයෙකු බව වැඩි දිනක් නොගොස් නාරොපාට අවබෝධවිය. ගුරුතුමා විටෙක කිසියම් ක්‍රියාකාරකමක යෙදී පසුව එය පැහැදිලි කළේය. තවත් විටක කිසිදු පැහැදිලි කිරීමක් නොකර ගෝලයාටම එය වටහා ගැනීමට ඉඩ දුන්නේය. හේ විටෙක රළු විය. තවත් විටෙක කුඩා දරුවෙකු මෙන් මෘදුවිය. සංසාරයෙහි ඇති අස්ථිර බව විශ්වාස තැබිය නොහැකි බව තම ගෝලයාට අවබෝධ කර දෙන්නට ඔහුට ඇවැසි විය.

දිනක් කපු රෙද්දක් හා තලතෙල් බෝතලයක් ගෙන ආ තිලෝපා කපු රෙද්දෙහි තලතෙල් ගා එය දල්වන මෙන් නාරොපාට කීය. කපු රෙද්දට ගිනි ඇවිළී අඟුරු පමණක් ඉතිරි විය.

"දැන් මේ උපමාවෙන් කියන්නෙ මොකක්ද?" හේ තම ශිෂ්‍යයාගෙන් විමසීය.

"තෘෂ්ණාව කපු රෙද්දකට උපමා කළ හැකියි. සත්‍යාවබෝධය ගින්නකට උපමා කළ හැකියි. සත්‍යාවබෝධය නම් ගින්නෙන් තෘෂ්ණාව දවාලීමෙන් සසර දුක අවසන් කළ හැකියි."

"හරියට හරි. දැන් ඒත් අඟුරු ඉතුරුවෙලානෙ."

"අඟුරුවලින් පෙන්නුම් කරන්නෙ අර්හත්ඵලයට පත් නැනැත්තාගෙ ප්‍රකෘති ශරීරය. කපු රෙද්ද පිළිස්සුවාම අඟුරු සුළඟට විසිරිලා ඉතිරි නොවී යන්නාක් වගේ සත්‍යාවබෝධය ලබපු කෙනා කය අත්හැරල තවත් තැනක උපදින්නෙ නෑ."

"හරියටම හරි!" තිලෝපා තම ශිෂ්‍යයාගේ දක්ෂතාවය ප්‍රසංසාවට ලක් කළේය.

තම අසපුව තුළට ගිය තිලෝපා පළිඟු මාණික්‍යයක් ගෙන එය නාරෝපාට පෙන්වීය.

"මොකක්ද මේකෙන් අදහස්වන්නෙ?"

"සත්‍යාවබෝධය ලැබීමෙන් පසු කෙළෙස් සියල්ල සුන්වී ගොස් සිත පළිඟුවක් වගේ පිරිසිදු වෙනවා."

"හරියටම හරි." තිලෝපා තම ශිෂ්‍යයාගේ දක්ෂතාව ගැන නැවත ප්‍රසංසා කළේය. තිලෝපා නැවත අසපුව තුළට ගොස් ලණුවක් ගෙන ගැට අටක් දමා එය නාරෝපාට ලබා දුන්නේය. නාරෝපා එකින් එක ගැට ලිහමින් අවසාන ගැටයත් ලිහා ලණුව මුදා හලේය.

"මේකෙන් මොකක්ද අදහස් වෙන්නෙ?"

"ලණුවෙ ගැට අටෙන් අදහස් වන්නෙ අෂ්ඨලෝක ධර්මය ගැන. පෘථග්ජනයා අෂ්ඨලෝක ධර්මයෙන් කම්පා වෙනවා. ලාභ ලැබෙන කොට සතුටු වෙනවා. පාඩු ලැබෙනකොට දුක්වෙනවා. සත්‍යාවබෝධය ලත් මුනිවරයා ලණුවේ ගැට ලිහා දමපු කෙනෙක්. ඔහු පාඩුත් අත්හරිනවා වාසිත් අත්හරිනවා. මේ ආකාරයට ඔහු සැනසිල්ලේ ජීවිතය ගෙවනවා."

තවත් දිනක තිලෝපා මුනිවරයා අගනා මැණිකක් ගෙන හිසමත තබා ගත්තේය. එසේ මඳවෙලාවක් සිට මැණික තමා ඉදිරියේ තබා ඒදෙස බලා සිටියේය.

"මට ඒ උපමාව තේරුණා. මැණිකෙන් අර්ථවත් වෙන්නෙ පැවිදි ජීවිතය. ඉක්මනට සත්‍යාවබෝධය ලබන්න කැමති කෙනා පැවිදි ජීවිතයට ඇතුළු වෙලා තමන්ගෙ පැවැත්ම සංවර කරගන්න



CamScanner

ඔන. එතකොටයි ගමන පහසු වෙන්නෙ. මැණික දිහා බලා හිඳීමෙන් අදහස් වෙන්නෙ. ශික්ෂණය. මං හරි නේද?"

තිලෝපා හිස සලා එය අනුමත කළේය.

තවත් දිනක තිලෝපා අසපුව තුළට ගොස් විශාල ජල බඳුනක්ද කුඩා හිස් බඳුනක්ද රැගෙන ආවේය. හේ විශාල ජල බඳුනෙන් ජලය ගෙන කුඩා බඳුනට දමා එය පානය කරන මෙන් නාරොපාගෙන් ඉල්ලා සිටියේය.

"මට වැටහුණු හැටියට නම් විශාල බඳුනෙන් අදහස් වන්නෙ ගුරුවරයා. කුඩා බඳුනෙන් අදහස් වන්නෙ ශිෂ්‍යයා. ජලය සත්‍යාවබෝධයට සමකරන්න පුළුවන්. සත්‍යාවබෝධය ලැබීමට කැමති තැනැත්තා එතැනට පත්වූ ගුරුවරයෙකු සොයාගොස් ඒ උපදෙස් අනුව අභ්‍යාස කළ යුතුයි. ජලය පානය කිරීමෙන් පිපාසය දුරුවන්නාක් මෙන් සත්‍යාවබෝධයේ සිහිලෙන් සියලු කෙළෙසුන්ගෙන් එන පීඩාව දුරුවෙයි."

තිලෝපා නැවත අසපුව තුළට ගොස් විශාල බඳුනක් හා කුඩා බඳුන් කිහිපයක් රැගෙන ආවේය. විශාල බඳුනේ ජලය පුරවා එයින් කුඩා බඳුන්වලට ජලය වත්කළේය. නැවත කුඩා බඳුන්වල ඇති ජලය විශාල බඳුනට රැස්කළ කල්හි එය පෙර තිබූ අයුරින් පිරී ගියේය.

"මට තේරෙන හැටියට ඔය උපමාවෙන් කියන්නෙ සියලු දේ එකම මූලධාතුන්ගෙන් හටගන්න බවයි. ඒ ඒ දෙය විනාශ වීමෙන් නැවත මූලධාතුවලටම එක්වෙනවා. මූලධාතුන්ගේ සංසරණය නොදන්නා අවියත් පෘථග්ජනයා මේ මගේ ශරීරයයි, මේ මගේ ගෙයයි ආදී ලෙස සංකල්ප මවනවා. ඒවා යළි මූලධාතු ලෙස බිඳී යන බව ඒවායේ අනිත්‍ය බව ඔහුට වැටහෙන්නෙ නැ. නමුත් සත්‍යාවබෝධය ලද තැනැත්තා සියල්ල මූලධාතුවලින් තැනුනු මායාවක් බව වටහා ගන්නවා."

තවත් විටෙක තිලෝපා තම අතැඟිලිවලින් මුද්දක හැඩයක් මවා පෙන්විය.

"මට වැටහෙන හැටියට මුද්දෙන් අදහස් වෙන්නෙ ධර්මය. ධර්මාවබෝධය ලැබීම සියල්ල ලැබීමට සමානයි. ඒකයි මුද්දෙන් අර්ථවත් වන්නෙ."

තිලෝපා තම හෘදය දෙසට ඇඟිල්ල දිගුකර සිටියේය.

"සියල්ල මනසේ නිර්මිතයන්. මනසින් සංකල්ප මැවීමෙන් ලෝකය සකස් වෙනවා. මනසෙන් සංකල්ප මැවීම අවසන් වූ කල්හි සත්‍යාවබෝධය එළඹෙනවා."

දිනක් එළිමහනේ ඇවිදිමින් සිටි තිලෝපා සර්පයෙකු අල්ලා උගෙ වලිගයෙන් ගැට ගැසුවේය. සර්පයා තෙමේම ඒ මේ අතට දඟලා ගැටය ලිහාගෙන යන්නට ගියේය.

"මේ උපමාවෙන් අදහස් වෙන්නෙ සත්‍යාවබෝධය කියන්නෙ තමන්ගෙ හිත මෙහෙයවලා තමන්ම ළඟාකරගත යුතු තත්වයක් කියල. සර්පයා තමන්ම ගැටය ලිහා ගන්නාක් මෙන් තමන්ගෙ චිත්ත සන්තානය තුළ ඇති කෙළෙස් ගැට ලිහා දැමීමෙන් සත්‍යාවබෝධය ලැබිය යුතුයි."

තවත් දිනෙක තිලෝපා කථා කළ නොහැකි බවක් හැඟවීය.

"ඒ උපමාවෙන් අර්ථවත් වෙන්නෙ සත්‍යාවබෝධය වචනයට නැඟිය නොහැකි බවයි. නිවන වචනවලින් විස්තර කළ නොහැකි බවයි."

ඒ සියලු ප්‍රායෝගික පාඩම්වලට නාරොපා සාර්ථක පිළිතුරු සැපයීමෙන් පසුව තිලෝපා පලතුරු මල්ලක් ගෙන ඔහු ඉදිරියෙන් තැබීය.

සත්‍යාවබෝධය ඉදුණු පලතුරු වගෙයි. ඒවා තමන් විතරක් පරිහරණය නොකළ යුතුයි. සත්‍යාවබෝධයට කැමති අයට එහි රසය බෙදා දිය යුතුයි.

"අන්න හරි. දැන් අපේ මූලික පාඩම් සියල්ල අවසන් දැන් තියෙන්න අමාරු පාඩම් ටික. ඊට කලියෙන් සරල භාවනා ටිකක් එහෙම කරල හිත තැන්පත් කරගෙන එන්න."

තිලෝපාගේ උපදෙස් පරිදි නාරෝපා වසරක කාලයක් හුදෙකලාව භාවනා කළේය. හේ වසර අවසානයේ ගුරුවරයා හමුවී මහා මුද්‍රා ඇතුළු උසස් භාවනා ක්‍රම හෙළිදරව් කරන මෙන් ඉල්ලා සිටියේය.



CamScanner

"ඔහේ ගෝලයෙක් හැටියට මේ දේ තේරුම් ගන්න ඕන. තමන්ට කරන්න පුළුවන් දේවලුත් තියෙනව. බැරි දේවලුත් තියෙනව. ඒ නිසා මම මුලින්ම කරන්නෙ ඔහෙගෙ කීකරුකම දක්ෂකම අවංකකම තැනට සුදුසු නුවණ පරීක්ෂා කරන එක. ඊට පස්සෙ මම සෑහීමට පත්වුණොත් ගුරුමුෂ්ටි නැතිව සේරම කියල දෙන්නම්."

නාරොපා ඒ කොන්දේසිවලට එකඟ විය.

# 10

# භයානක අභ්‍යාස මාලාවක්

තිලෝපා මුනිවරයා දෙවන අභ්‍යාස මාලාව ඉගැන්වීම ආරම්භ කරනු පිණිස නාරොපා ද කැටුව ඉතා උස්වූ කඳු මුදුනකට නැංගේය.

"අර පේනවනෙ කන්දෙ තරම. අපට බිම ඉන්න මිනිස්සු පේන්නෙ කුකුළු පැටව් වගේ. මම ඔහේව මේ කඳු මුදුනට එක්ක ආවෙ පොඩි පහේ පරීක්ෂණයකට නොවෙයි. ඔහේ හැබෑම ගෝලයෙක් නම් කීකරුකම පෙන්නන්න වෙනවා. ඔහේ මට කීකරු නම් මේ කන්දෙන් පහළට පැනල පෙන්නනවා."

නාරොපා දිගු හුස්මක් ගෙන කන්දෙන් පහළට පැන්නේය. ගලක වැදීමෙන් ඔහුගේ හිස පොඩිපට්ටම් වී මොළ කැබලි විසිර ගියේය. අතපය සතර ද කොඳු නාරටිය ද බිඳී ගියේය. හේ පල්ලමට වී අවසන් හුස්ම හෙළන්නට සූදානම් විය.

"හා... හා... පණ නම් යවාගන්න එපා. ඔන්න දැන් අපි බලමු වෙන්නෙ මොකක්ද කියල!"

මෙසේ කියූ තිලෝපා, නාරොපාගේ ශරීරයේ බිඳුනු කොටස් සියල්ල එක් තැන්කර සිතේ බලයෙන් පෑස්සුවේය. තුවාල කැළැල් කිසිවක් ඉතිරි නොවීය. නාරොපා පෙර සිටි පරිදිම නැගී සිටියේය.

"මළ සිරුරුවලට පණ ගන්වන එක සත්‍යාවබෝධයෙන් බාහිර දෙයක්. ඔය රහස් මට හෙළිකළේ මට හිතවත් ඩාකිණියක්."

'ඩාකිණි' යනුවෙන් හඳුන්වන ලද්දේ වන දේවතාවියන් විශේෂයකි.

"මිනිසුන්ට භෞතික ශරීරයට තියෙන ඇල්ම අත හරිනකම් සංසාර චක්‍රයෙන් නිදහස් වෙන්න බෑ. ඒ පාඩමත් මෙතැනදී මට කියලදෙන්න ඕන වුණා. සත්‍යාවබෝධය ලැබීමෙන් පසු භෞතික



CS CamScanner

ශරීරය කියන්නෙ මායාවක්ය යන්න වැටහෙනවා. එතැන් සිට භෞතික ශරීරයත් එක්ක තියෙන මානසික බැඳීම අවසන් වෙනවා."

නාරොපා ඒ භයානක අභ්‍යාසයෙන් තැති ගැන්මට ලක්ව ගුරුවරයාගෙන් වෙන්වී හුදෙකලාව භාවනාව පුගුණ කිරීම ඇරඹීය. දිනක් තිලෝපා මුනිවරයා ඔහු සොයා පැමිණියේය.

"හා දැන් පණ එපැයි කියාගෙන ආපු කෙනාට ඉගෙනීම ඇතිවෙලා වගේ."

"නෑ. මම තනිවම සත්‍යාවබෝධය ලබන්න වෙහෙසෙනවා. මොකද මට තවමත් අර ඇටකටු පොඩිවුණු සිද්ධිය මතක් වෙලා රෑට නින්ද යන්නෙ නෑ."

"හොඳයි අද අපි ඔය බය ඇරෙන්න මොකක් හරි අභ්‍යාසයක් කරමු." නාරොපා දියෙන් ගොඩ දමන ලද මාළුවෙකු මෙන් ගැහෙමින් ගුරුවරයා පසු පස ගියේය.

"ඔහේ අර සිද්ධියෙන් පස්සෙ කඳු නගින්න බයයි නෙ. අපි යමු කුඹුරු තියෙන පැත්තෙ ටිකක් ඇවිදින්න."

එය ගොයම් කපා පාගා අවසන්ව ඉපනැලි මතුව ඇති කාලයයි. ඒ කාලයට ගමේ කොළු ගැටව් විනෝදයට කුඹුරු ගිනි තබති. සමහර ගොවීහු නොදැනුවත්කම නිසා පස සරුවන්නට කියා ගිනි තියති. එවැනි මහා ගින්නක් කුඹුරක් මැද ඇවිලෙමින් තිබුණි.

"හා ඔහේ කීකරු ශෝලයෙක් වෙන්න පොරොන්දු වුණානෙ. දැන් දුවල දුවල ගිහි අර ගින්දරට පනිනවකො."

ගුරුවරයාගෙන් ගැලවීම ලෙහෙසි නැත. නාරොපා දෙගිඩියාවෙන් යුතුව දිවගොස් ගින්දර මැදට පැන්නේය. විටි විටි ගාමින් ඔහුගේ කොණ්ඩයත් සිවුරත් ගිනි ඇවිළී බරපතල පිළිස්සුම් තුවාල ඇතිවිය.

"ඔහේට දැන් කොහොමද?"

"කොහොමද කියලත් අහනවා. මම දැන් හොඳටම පිච්චිල පණ ඇරගන්න බැරුව දඟලනවා."

තිලෝපා අධිමානසික බලයෙන් සුළු මොහොතක් තුළ ඒ තුවාල සියල්ල සුවපත් කළේය.

පෘථග්ජනයාට සතර මහා භූතයන්ගෙන් තැනුණු ශරීරය යථාර්ථයක් ලෙස පෙනෙයි. හේ ඊට ඇලුම් කරයි. නමුත් එහි අනිත්‍යතාව පසක් කරගත් දාට ඔහු ඒ ශරීරය කෙරෙහි ඇල්ම දුරුකර සත්‍යාවබෝධය ලබයි.

නාරොපා ගුරු ඇසුරෙහි හිඳ දිනපතාම භාවනා කරමින් සත්‍යාවබෝධය සඳහා වෙහෙසුණේය. තිලෝපා යනු තවුසෙකි. නාරොපා යනු බෞද්ධ භික්ෂුවකි. ඒ දෙදෙනාම ජීවත්වූයේ ගෙපිළිවෙලින් පිඩුසිඟා වැඩීමෙන් ලබන ආහාරයෙනි. දිනෙක නාරොපා පිඩුසිඟා වැඩි අතර තවත් දිනෙන තිලෝපා ඒ සඳහා පිටත්ව ගොස් ඉක්මනින්ම රසමුසු භෝජනද රැගෙන අසපුවට එයි. එදින එළඹ තිබුණේ නාරොපාගේ වාරයයි. හේ පාත්‍රයද කැටිව පිඩුසිඟා යන අතර මඟුල් ගෙයක් අසලට පැමිණියේය. මඟුල් ගෙදර මිනිස්සු එළිපත්තේ සිටි බෞද්ධ භික්ෂුව දැක පාත්‍රය පිරෙන්නට රසමසවුළු එහි ලා පාත්‍රය ආපසු දුන්හ.

"ෂහ්! කාලෙකින් මෙ වගේ ටේස් බැදුම් කෑවෙ නෑ! අල ටේස්! ලූනු ටේස්! එතකොට කටලිස්! පැටිස්! ඤම් ඤම්!" තිලෝපා කවදාවත් නොමැති විදියට ගිජුකමක් පෙන්වා තලු මරමින් දානෙ වේල ගිල දැම්මේය.

"හප්පේ! මට නම් මදිත් වගේ!"

දත් වළදා අවසානයේ තිලෝපා කීය.

"මම ආපහු පාරක් ගිහින් පිඩුසිඟාගෙන එන්නද?"

"ඒ මොන මෝඩකමක්ද?"

"එතකොට මිනිස්සු හිතනවා අපි හරි බඩජාරි අය කියලා."

"එහෙනම් වෙන මොනව හරි උප්පරවැට්ටියක් දාල කෑම ටිකක් උස්සන් එන්නද?"

"ඒක ඉතිං ඔහෙගෙ කැමැත්තක්. ඔහෙට ආරක්ෂාව ගැන බයක් හිතෙනවනම් මේ පැන් කෙණ්ඩියයි ලී කඩුවයි අරන් යන්න."

නාරොපා ලී කඩුවත් පැන් කෙණ්ඩියත් රැගෙන හොර බළලෙකු සේ අඩියෙන් අඩිය මගුල් ගෙරදට කිට්ටු කළේය. දැන් වෙලාව දහවල් දොළහත් පසුවී ඇත. මගුල් ගෙදර අය හොඳටම බීල දෙකට කැපුණු පණුවො වගේ අර පැත්තට මේ පැත්තට ඇඹරෙති. ඇඹරෙනවා. බීල නටන අය හිතන්නෙ තමන් ලස්සනට නටනව කියල. ඒත් දකින අයට වසම වස අප්පිරියාවයි!

නටන අයට තරමක් එහායින් මගුල් මේසවලට කෑම සූදානම් කර ඇති ආකාරය නාරොපා දුටුවේය. හේ හොර පූසෙකු මෙන් වැටට උඩින් පැන ජනේලයෙනුත් පැන මගුල් ගෙට ඇතුළුවී කට්ලිස් පැටිස් ලූණු වේස් අලවේස් අරවද මේවද එකී මෙකී නොකී සියලු දේ පාත්‍රයට බෙදාගෙන ලී කඩුවත් කිහිල්ලේ ගහගෙන ජනේලයෙන් පැන්නේය.

අභාග්‍යයක මහත්!. නාරොපා පනින්නට ගොස් පිත්තල සෙම්බුවක් පෙරළී මහ හඬක් නැගුණි.

"අන්න හොරෙක්. ඔහෙ හිටපිය. අල්ලපියෝ. මරපියෝ!" ආදී ලෙස කෑමොර දෙමින් මගුල් ගෙදර බීමත් පිරිස නාරොපා පසුපස එලවන්නට වූහ.

යාර තුන් හාරසීයක් දිවූ පසු නාරොපාට හොඳටම හති වැටුණි. හේ කරකියාගත දෙයක් නොමැතිව වතුර සෙම්බුව තමන් දෙස එන පිරිස ඉදිරිය හැළීය. විස්මයකි! ඒ හා සමඟ දෙපිරිස වෙන් කරමින් නොගැඹුරු දියපහරක් ඇතිවිය. මගුල් ගෙදර සිට පැමිණි චණ්ඩි සේරම නාරොපා ලුහුබඳිමින් නොගැඹුරු වතුරේ බැස ජකිරි බකිරි යන සද්දෙන් වතුර කලතමින් පැමිණියහ.

ගුරුවරයා දුන් හාස්කම් ඇති ලී කඩුව ඔහුට මතක් විය. හේ ලීකඩුව තමා වටා කරකැවීය. විස්මයකි! එවේලේම නාරොපා වටා යකඩ වැටක් ඉදිවිය. දියේ බැස පීනා ආ මිනිස්සු යකඩ වැටෙන් කොටුවී සිටි නාරොපා පහසුවෙන්ම අල්ලාගෙන තලා පෙලා හිරිහැර කර මඟදමා යන්න ගියහ.

නාරොපා හවස් වරුවේ නාහෙන් කටෙන් ලේ පෙරාගෙන අසපුවට පැමිණියේය.

"හොරකම කියන්නෙ කියන්න බැරිතරම් නරක වැඩක්. හොරකමෙන් ඇතිවන ප්‍රතිවිපාක කලින් තීරණය කරන්න බෑ. ඒකයි අද පාඩම."

තිලෝපා තම ශිෂ්‍යයාගේ තුවාල සුවපත් කිරීමට අධිමානසික බලය යොදවමින් එසේ කියා සිටියේය.

# 11

# නාරොපා, මාතංග තවුසාගේ චරිතයට පණදෙයි.

දිනෙක නාරොපා සහ තිලෝපා යන දෙදෙන ගමනක් යන අතර පටු දියපාරක් හමුවිය. දියපාරෙන් එතෙර වීමට තිබූ ඒදණ්ඩ බිඳී තිබුණි. පහළින් තිබුණේ හුංගන් සහ කුඩැල්ලන් ගහණ දිය පහරකි.

"ඔන්න දැන් නියම ගෝලයෙක්ද කියල බලන්න තවත් අවස්ථාවක්. ඔහේ දැන් මාතංග බෝධිසත්වයො නියත විවරණ ගත්ත දවසෙ හිටිය වගේ ඒදණ්ඩක් විධියට ඉන්නවා. මම ඔහේගෙ ඇඟ උඩින් නැගල එතෙර වෙන්නම්."

නාරොපා දිය පාර හරහා ඒ දණ්ඩක් මෙන් දිගා වී සිටින අතර තිලෝපා ඔහුගේ කඳ මතින් පය තබා එය තරණය කළේය.

ජබෝග්.....! යනුවෙන් මහ හඬක් නංවමින් නාරොපා වතුරට වැටුණු අතර තිලෝපා දතිපතිගා එහා පැත්තට පැන ගත්තේය. මිනිත්තු දහයක් පහළොවක් සිසිල් ජලය සමග පොරබැදීමෙන් ද කුඩැල්ලන් සහ හුංගන් සපා කෑමෙන් ද නාරොපාට සන්නි රෝගයක් වැළඳුනි.

"ඔහේට ජල සන්නිය හැදිල වගේ. මම දැන් ඔය ජල සන්නිය හොඳ කරන්නෙ නෑ. මොකද මට දැන් ඔය වගෙ පුංචි පහේ වැඩ කරලම ඇතිවෙලා. මෙන්න මේ අභ්‍යාසය කරලම බලන්න."

තිලෝපා තාප යෝග රහස් නාරොපාට කියා දුනි. නාරොපා ශරීර අභ්‍යන්තරයේ ඇති කුණ්ඩලිණී චක්‍ර පුබුදුවා තාපය උපදවාගෙන රෝගී තත්වයෙන් අත්මිදුණේය.

තවත් එක් දිනක ගුරු ගෝල දෙදෙන වැලිතලාවක් හරහා යමින් සිටියහ. වැලිතලාවේ ඈත යන මිනිසෙකු දුටු තිලෝපා ඔහුව අල්ලාගෙන එන මෙන් නාරෝපාට අණකළේය. නාරෝපා වැලිතලාව හරහා දුවන්නට තැත් කළ ද තබන තබන පය වැල්ලේ එරී ගියේය. අවසානයේ ඔහු දුවන්නට බැරිව වැලිගොඩ මත ඇද වැටුණේය.

"ඔන්න අහගන්න අද පාඩම. පෘථග්ජන මිනිස්සු හැමදාම දුවන්නෙ අල්ලන්න බැරි ඉලක්ක පස්සෙ. එයාල ඒ ඉලක්ක අල්ලන්න බැරිය කියල තේරුම් ගන්නෙ ජීවිතේ හොඳම කාලෙ ගිහින් හොඳටම හති වැටුණු පසුවයි."

තවත් දිනක ගුරු ගෝල දෙපල මහ මග යන අතර මඟුල් පෙරහරක් ඔවුන්ට හමුවිය. මනාලයා අසුපිට නැග මුළු ලෝකයම දිනාගත්තාක් මෙන් උජාරුවෙන් සිටියේය. සුරූපී මනාලිය මඟුල් ඇඳුමෙන් යුතුව ඔහුගේ කරවටා අත් යවා අල්ලාගෙන උන්නාය.

"බලාපංකො අරූගෙ උජාරුව! ඌ හිතං ඉන්නෙ ලෝකෙ ඉන්න ලෙකුම වාසනාවන්තයා ඌය කියල. තව ටික දොහක් යනකොට මනමාලි ළමයි වදන්න ගන්නව. එතකොට උන්දැගෙ කටෙ සැර.. කවු බැල්ලි වගේ කෑ ගහන්න ගනීවි. එතකොට මිනිහට හිතේවි මොන මොට්ට වැඩක්ද කරගත්තෙ කියල. අපි ඕකුන් දෙන්නට හොඳ මට්ටුවක් කරන්න ඕන. අස්සයගෙ කටකලියාවෙන් අල්ලගෙන ඔය හාදයව බිමට ඇදල දාපන්!"

ගුරුවරයා කවදාවත් මෙලෙස කේන්තියෙන් කථා කර නැත. නාරෝපා ඔහුගේ තරම හොඳටම දනී. හේ දෙවරක් නොසිතා ඉදිරියට ගෙන අස්සයාගේ කට කලියාවෙන් අල්ලා නැවැත්විය.

"ඒයි බැහැපිය තෝංජලයා. තොට ලැජ්ජ නැද්ද ඩබල් දාල මේ අහිංසක සතාගෙ පිට උඩයන්න!"

මනමාලයා අසු පිටින් වැටී තුවාල ලැබීය. මනාලිය අසුපිට තනිවූ අතර අස්සයා ඇය රැගෙන හැල්මේ දුවන්නට විය. බලා ඉන්න අයට එක විට ඇඬෙන, එකවිට හිනායන සිද්ධියකි. එකවිට කෝප ගැන්වෙන, එකවිට අනුකම්පා හිතෙන සිද්ධියකි. මංගල චාරිකාවෙහි යෙදුණු පිරිස අශ්වයා මෙල්ල කිරීම පසෙක තබා

නාරොපා වටකරගත්හ. ඔවුහු ඇති වනතුරු නාරෝපාට ගුටිබැටවලින් සංග්‍රහ කර මහාලයාත් කැටුව අශ්වයා සහ මනාලිය සොයාගෙන පිටත්ව ගියහ. එවර නාරොපාගේ ජීවිතය බේරුණේ අනු නවයෙනි.

මෙවැනි අප්‍රසන්න සිදුවීම්වලට කෙළවරක් නැතිව මුහුණ දෙන්නට නාරොපා හට සිදුවිය. එදින එරට රජු අගමෙහෙසිය සමග අසුපිටින් යමින් හිටියේය.

"පේන්නැද්ද අරූගෙ උජාරුව. ඕකා තමයි මේ රට කන එකා. ඌ හිතං ඉන්නෙ මුළු රටේම ගෑනු ඌට අයිතියි කියල. ඌ හිතං ඉන්නෙ මුළු රටේම ඉඩකඩම් උගේ පවුලට අයිති කියල. මම අයිමත් කියන්න කලින් දුවල ගිහින් මූව අස්සයගෙ පිටෙන් ඇදල දමපං!"

ගුරුවරයා නැවතත් සැරවී ඇත. අදත් බඩපිරෙන්නට සංග්‍රහ ලැබෙන දවසකි. නාරොපා එදිනත් ඉදිරියට දුවගොස් අශ්වයාගේ කටකලියාවෙන් අල්ලා රජු බිමට ඇද දැමුවේය. රාජපුරුෂයෝ නාරොපා අල්ලාගෙන ගුටිබැටදී මරණ වධයට පමුණුවාලීම සඳහා රජවාසලට රැගෙන යන්නට වූහ.

"ඔන්න ඔය පිස්සා අතහැරලදාපං කොල්ලනේ."

රජතුමාගේ වචනවලට කීකරුවූ රාජපුරුෂයෝ ඔහු මුදාහළහ. රජතුමා අසුපිටින් වැටී තුවාල ලැබ යළි මාලිගයට ගියේය.

"දුක, වේදනාව, කියන්නෙ මමත්වය සමඟ බැඳුණු අත්දැකීම් මාලාවක්. සත්‍යාවබෝධය ලැබීමෙන් මමත්වය නැතිවෙනවා. ඒ හා සමඟම දුකත් නැතිවෙනවා. අර්හත්ඵලයට පත්වූ කෙනෙකුට කවදාකවත් දුකක් දැනෙන්නෙම නෑ."

කාලය කෙමෙන් ඉකුත්වී යද්දී නාරොපා සිය ගුරුවරයා සෙවණෙහි හිඳ කුණ්ඩලිනී යෝග ක්‍රමය භාවනා ක්‍රම ආදිය පිළිබඳ බොහෝ රහස් උගත්තේය. ගුරු සිසු දෙදෙන එදින අසපුවෙන් පිටව ගියේ ගම රට පිළිබඳ විස්තර බලනු පිණිසය.

ආරක්ෂක නිලධාරීන් පිරිවරාගෙන අශ්වපිට එන තඩමහත තරුණයෙක් ඔවුන් දෙදෙනාගේ නෙත ගැටුණි.

"ඔහෙ පලයං! අර අපේ රජ්ජුරුවන්ගෙ පිංගුත්තර පුත්‍ර රත්නයනෙ! බලමුකො මූ අශ්වයා පිට යන උජාරුව. මූත් තාත්තටම දෙවෙනි නැති පාදඩයෙක්. මුං මුළු රටම විකුණගෙන කන්න ආපු හරුම පාපතර පවුලක්. හෙමීට ළංවෙලා ඔය රට මදාවියව අශ්වයා පිටින් බිමට ඇදල දාපං. මං ඉතුරු ටික බලාගන්නං."

එසේ කියූ තිලෝපා හෙමිහිට ගහකට මුවා විය. නාරොපා ගුරුවරයාගේ අණට කීකරුව ඉදිරියට ගොස් අශ්වයාගේ කට කලියාවෙන් ඇද නවත්වා රාජ කුමාරයා අශුපිටින් ඇද බිම දැමීය. එවර ඔහු අත ගැසුවේ පෙර නොකරන ලද අන්දමේ මෝඩ තකතිරුකමකටය. රාජ පුරුෂයෝ වහ වහා ඉදිරියට පැන නාරොපා වටකරගත්හ.

"කාලකණ්ණි ඉරිසියාකාරයෙක්. රජ පවුල්වල අය සැප විඳින විධිය හරිහැටි දැක්කොත් මූ එවෙලෙම පපුව පැලිල මැරේවි. මූට ආයෙමත් බත් කන්න ඉඩ තියන්න නරකයි."

රාජ කුමාරයා ගෝරනාඩු කළේය. රාජපුරුෂයෝ නාරෝපා වෙත පැන ඔහුගේ ඇඳුම් කීතු කීතු ඉරා දමා කඩුපහර හා හෙල්ල පහර කිහිපයක් දී ඔහුව කාණුවට ඇද දමා යන්නට ගියහ.

එතෙක් වෙලා ගසට මුවා වී සිටි තිලෝපා රාජ පුරුෂයන් ඉවත්ව ගිය පසු නාරොපා වෙතට පැමිණියේය. නාරොපා ලේ විලක් මැද පණ අදිමින් සිටියේය. ඔහු යමක් කියන්නට සැරසුණත් මුවින් වචන පිට නොවිය.

"ඕකනෙ මං කිව්වෙ උදව් ඕන නම් එන්න කියන්න කියල. මං අතන ගහ අස්සෙ හැංගිලයි හිටියෙ."

"මෝඩ කොලුවා. හහ්. හහ්. හා..!"

තිලෝපා පණ අදිමින් සිටින තම ගෝලයා දෙස බලා කොක් හඬලා සිනාසෙන්නට විය. හේ කුණ්ඩලනී බලය උපයෝගී කරගෙන සුළු මොහොතක් තුළ නාරොපා සුවපත් කළේය.

"හා දැන් භයානක පාඩම් සේරම ඉවරයි. අපි දැන් අද, ඉදගෙන පරකාය ප්‍රවේශය කියන පාඩම් මාලාව ඉගෙන ගනිමු."

පරකාය ප්‍රවේශය යනු නාරෝපාගේ යෝග විද්‍යාවෙහි තිබෙන අපූරු අභ්‍යාස ක්‍රමයකි. එම අභ්‍යාස උගත් අයෙකුට තමන් කැමති පරිදි කය හැරදා ගොස් මෘත දේහයකට පණ දීමට හැකිය. ට්‍රොන් ජුග් හෙවත් ඩ්‍රොන් ජුග් නම් ඒ අභ්‍යාස ක්‍රමය ප්‍රගුණ කිරීම ඉතා පහසු බව සඳහන්ය.

12

# නාරොපා සිවුරු හැර විවාහ වෙයි.

වසර ගණනක් ගතවන විට තිලෝපා මුනිවරයා වෙත තව තවත් ගිහි පැවිදි පිරිස් පැමිණ යෝග භාවනා ක්‍රම උගත්හ. තිලෝපාගේ ඇස් රතුවන විහිළුවලට බියෙන් සමහරු ටික දිනකින්ම අසපුව හැර ගියහ.

"මං ඔහෙට හොඳ යෝජනාවක් ගේන්නං."

"ඔහේ ආපහු සැරයක් කසාද බඳින්න ඕන. මගේ අසපුවට යන එන හොඳ පුෂ්ඨිමත් කෙල්ලෙක් ඉන්නව. මං උන්දැට කිව්ව නරෝපට මගුල් විසේ ඔළුවට ගහල තියෙන්නෙ. උඹල දෙන්න කසාද බැඳපල්ල කියල. ඒකි මගෙ හාස්කම්වලට බයෙන්දෝ කටක් ඇරල වචනයක්වත් කිව්වෙ නෑ."

ඒ වන විටත් මැදිවියට පැමිණ සිටි නාරොපා තිලෝපාගේ බලකිරීම මත සිවුරු හැර යන්තම් අවුරුදු දහසයක් වයස කෙල්ලක හා විවාහ වූයේය.

"අන්න නාරොපා හාමුදුරුවො සිවුරු ඇරල. තව ලැජ්ජ නැතිව තමන් එක්කම භාවනා කරන කෙල්ලක්ලු. කසාද බැඳල තියෙන්නෙ. නාකි විසේ ගෙටත් උසේ."

මිනිස්සු නාරොපාට ඇසෙන්නට ඇනුම් පද කීහ. නාරොපා දෙගිඩියාවෙන් යුතුව විවාහ ජීවිතය ගත කළේය. වසර කිහිපයක් ඉක්ම යන විට ඔහුට තම ඇඹෙනිය හොඳටම එපා විය. ඒකි කසාද බඳින කොට හා පැටියෙක් වගේ අහිංසකයි. දැන් දැන් ව්‍යාඝ්‍ර ධේනුවක් වගේ තමයි මගේ ඇඟට කඩා පනින්නෙ. මට වෙලාවකට හිතෙනව දිවි නහගත්තනම් මීට හොඳයි කියල. ඇරත් මම සිවුරු ඇරල කරගත්තෙ මහා ගොං කමක්. ගිහිගෙය ගිනි ගෙයක් කියල මට දැන් හොඳටම වැටහෙනවා!"

නාරොපාගේ ශෝකාලාපයට කන්දුන් තිලෝපා කොක්හඬලා සිනාසෙන්නට විය.

"ඔන්න ඔය ටික වටහල දෙන්න තමයි මම ඔහේට මඟුලක් පංගාර්තු කරල දුන්නෙ. ලෞකික ලෝකයේ මතුපිටින් පේන්න තියෙන ආදරය කියන්නෙ තනිකරම මායාවක්. තම තමන්ගේ අවශ්‍යතා ඉටුකරගැනීමේ ක්‍රියාවලියක් ඒ යටින් තියෙන්නෙ. මේක හොඳට තේරෙන්නෙ ජීවිත කාලෙන් බාගයක්වත් ගෙවපු මිනිහෙකුට විතරයි. ඇරත් ඔහේට අනිත් කෙනෙකුට වැඩිය ඉක්මනට ජීවිතේ ගැන කළකිරෙන්න හේතු තිබුණා. ඔහේ නිතරම කල්පනා කළේ මම සිවුරු ඇරපු එක හරිද වැරදිද? මම ආපහු කසාද බැඳපු එක හරිද වැරදිද? ඔන්න ඔයවගේ ප්‍රශ්න. මේ විධියට දෙපැත්තට ඇදෙන්න ගියාම හිතට මහා එපාවීමක් කළකිරීමක් ඇතිවෙනවා. මෙන්න මේ ටික හොඳට මතක තියාගන්න. අපේ ජීවිත ගෙවල දාන්න ඕන අන් අය කියන හැටියට නෙවෙයි. අනුන්ගෙ විවේචනවලට බයේ අනුන්ට ඕන ඕන විධියට ජීවත් වෙන බයියොන්ට සත්‍යාවබෝධය ලබා ගන්න තියා පවුල් පන්සල් වෙලවත් පණ බේරගෙන ඉන්න බෑ. මං කී දේ තේරුණාද? නාරොපා හිස සලා ගුරුවරයාගේ අදහස් අනුමත කළේය."

# 13

# අන්තරාභවය තුළ පරිනිර්වාණය

තිලෝපා මුනිවරයා හමුවේ වසර ගණනාවක් භාවනා පුහුණු කළ පසු එතුමා වෙතින් තමන්ට නිසි පිළිගැනීමක් ලැබෙනු ඇතැයිද තමන්ට සිසු පිරිස අතර ගෞරවනීය තත්වයක් ලැබෙනු ඇතැයිද නාරොපා බලාපොරොත්තු විය. එනමුත් සිදුවූයේ හාත්පසින්ම වෙනත් දෙයකි. දිනක් නාරොපා සිය ගුරුවරයා වෙත ගොස් වැඳ නමස්කාර කළේය.

"හ්ම්... දැන් තමුන් මගෙන් බොහොම උසස් ඉගැන්වීම් ගණනාවක්ම ඉගෙන ගත්තනෙ. දැන් ඔහේ මට ගුරු පූජාවක් තියන්න කාලෙ හරි!"

"ගුරු පූජාවක් කරන හැටි කිව්වොත් මට ඒ විදියට කරතැකි!"

"එහෙනම් දැන් තමුන්ගෙ උරහිස පළල ලේ ගොටුවක් අරගෙන ඒක මට පූජා කරන්න!"

නාරොපා සිය ගුරුවරයා තමන්ගෙන් මෙවැනි ඉල්ලීමක් කරතැයි කිසිදින බලාපොරොත්තු නොවීය. එම පිළිකුල් සහගත ක්‍රියාවට සිත හදා ගැනීම බොහෝ අපහසු විය. හේ දෙගිඩියාවෙන් යුතුව ඉදිරිපත් වී සැතක් ගෙන තම උරහිස පළා ලේ ගෙන ගුරු පූජාවක් කළේය.

"හ්ම්... දැන් බාර්ඩෝ යෝග ශාස්ත්‍රය ඉගෙන ගන්න වෙලාව හරි."

නාරොපා ගුරු උපහාර පූජාවෙන් පසු බාර්ඩෝ යෝග ක්‍රමය උගත්තේය.

"දරුව, මිනිස්සු මරණය නම් දොරෙන් එපිට ඇති දේ නොදනිති. ඔවුහු ජීවිතය නම් රඟමඩලේ නළුවන් ලෙස රඟපා තම ආයු අවසන මිය පරලොව යති. එලෙස මිය පරලොව

යන සත්වයන් ඊළඟ උපතට යන තෙක් පසු කළ යුතු අසීරු කාලසීමාවක් ඇත. ඊට අන්තරාභවය කියාද බාර්ඩෝ අවස්ථාව කියාද කියනු ලැබෙයි. සත්ත්වයා මරණයට පත්වූ පසු බාර්ඩෝ අවස්ථාවන් දෙකක් පසුකර ඉන් අනතුරුව කර්මානුකූල උපතකට යොමුවෙයි. දෙවන බාර්ඩෝ අවස්ථාව පසුකරද්දී අනුන් දෙන පින් අනුමෝදන් විය හැකිය.

මුල් බාර්ඩෝ අවස්ථාව තුළදී පළමුව සත්ත්වයා සිහිමුලාව කල් ගෙවයි. ඔහු අනුක්‍රමයෙන් සිහි එළවා ගත් පසු තමන්ගේ නෑ සියන්ද, ආරක්ෂක දේවතාවන්, නිරයේ නිරයපල්ලන් ආදීන්ද පෙනී යයි. මෙලෙස පෙනෙන නිරයපල්ලන්ද, ආරක්ෂක දේවතාවන් ද සැබෑටම එතන නොසිටින බවත් තමන්ගේ කර්මානුරූපව ඒ දර්ශන දිස්වන බවත් ඒ දර්ශන මායාවන් බවත් සිතට ගත යුතුය. ඒ දර්ශන මායාවන් බව මළගිය ඇත්තා නොද-න්නා කමින් ඔහු ඊට බිය වෙයි. කෙසේ නමුත් දෙවැනි බාර්ඩෝ අවස්ථාවේදී සත්ත්වයාට කර්මානුරූව සිය අනාගත උත්පත්ති ස්ථානය පිළිබඳ ආලෝක නිමිති පහළ වෙයි. මේ අවස්ථාව වන විට තැති ගැනීමට හා ප්‍රශ්නාර්ථය රැසකට පත්ව සිටින සත්ත්වයා කළ හැකි අන් කිසිවක් නොතේරී කර්මානුරූපව පැන නගින ආලෝක ධාරා වෙත ඇදීගොස් කර්මානුකූල උත්පත්ති ස්ථානය කරා යොමුවෙයි.

යමෙක් මෙයාකාරයෙන් නිරයට යොමු වුවහොත් නිරය පල්ලෝ ඔහු අල්ලාගෙන ධර්මරාජ නම්වූ යමරජු වෙත පමුණුවති. එම්බා නිරිසත්වය තා කළ හොඳ නරක කියවයි යමරජු ඔහුගෙන් විමසයි. එකල්හි නිරිසත්ත්වයා බියට පත්ව අසරණ වේ. ඒ හා සමගම නිරිසත්ත්වයාගේ සහයට සාධු ප්‍රාඥ නම් අධිකරණ සහායකයෙකු පහළ වෙයි. සාධු ප්‍රාඥයා සැබැවින්ම සිටින අයෙකු නොව නිරිසත්ත්වයාගේ කර්මය අනුව පැන නගින මායාවකි.

දරුව, මේ අවස්ථාව වන විට නිරය පල්ලෝ ඒ නිරය සත්ත්වයා කළ පව් සම්බන්ධ විස්තර ඇති පව් පොත සොයාගෙන එය රැගෙන එති. නිරය පල්ලන් පව් පොත කියවන අතර තවත් සහායකයෙක් ඒ පව් ගණන ගල් කැටවලින් පෙන්වයි. සාධු ප්‍රාඥයා පින්කම් ගැන කථා කරන කල්හි ඒ පින්කමද එයාකාරයෙන් පෙන්වයි. පව් හා පින් සසඳා බලන නිරය පාලකයා නිරිසත්

වධයට පමුණුවන්නේද නැතිනම් නිදහස් කරන්නේද යන තීරණය ලබා දෙයි. නිරිසතා වධයට පමුණුවනු ලැබීමට තීරණය කළ හොත් නිරය පාලකයෝ ඔහු දම්වැල්වලින් බැඳ ගෙන ගොස් වධයට පමුණුවන ස්ථාන වෙත හෙළති.

දරුව මා පෙර කී අන්තරාභවය සිහි නුවණින් යුතුව ගුරු උපදෙස් අනුව ගෙවා දැමුවහොත් අන්තරාභවය තුළදීම නිර්වාණය සාක්ෂාත් කළ හැකිය. අන්තරාභවිකයා දින ගණනක්ම තමන් පෙර සිටි ගෘහය ආශ්‍රය කරගෙන එහි අහුමුලුවල හැංගී සිටියි. ඒ අවස්ථාවේ ඔහුට ඇසෙන්නට අන්තරාභවය තුළ නිර්වාණය ලබන හැටි ශබ්ද නගා කිව යුතුය. අන්තරාභවයේ දකින ආලෝකයන් නිවනට සමාන කරන්න. අන්තරාභවයේ දකින සෑම රූපයක්ම, දෙව් දේවතා රූපයක්ම වීතරාගී බුදුපියාණන්වහන්සේගේ රූප බව සිතන්න. මේ ආකාරයට කටයුතු කළහොත් සියලු ආකාර ගර්භද්වාර වැසී යයි. සියලු ආකාර උත්පත්ති ස්ථාන අවහිරවී යයි. සත්ත්වයා අන්තරාභවය තුළදී පිරිණිවනට පත්වෙයි.

දරුව, තවද මේ දෙයද දැනගනුව. අන්තරාභවිකයාගේ සිතෙහි කර්මණ්‍යතාව මිනිස් සිතක බලයට වඩා සත් ගුණයකි. ඒ නිසා අන්තරාභවිකයාට ප්‍රකෘති මිනිසෙකුට වඩා හත් ගුණයක් පහසුවෙන් නිර්වාණාවබෝධය කළ හැකිය."

නාරොපා සිය ගුරුවරයාගේ ඉගැන්වීම් එකලස් කර අන්තරාභවය තුළ පරිනිර්වාණය නම් ග්‍රන්ථය ලිවීය.



CamScanner

# 14

# තිලෝපා මුනිවරයාගෙන් කදිම භාවනා පාඩමක්

"අද අපේ පාඩම මහා මුද්‍රා භාවනාව. මුද්‍රාවක් කියල කියන්නෙ අත්වල ඇඟිලිවලින් හදාගන්න කිසියම් සංකේතයක්. මහා මුද්‍රා කියන්නෙ ගෞතම බුදුන්වහන්සෙ නිතර හුරු කරපු භාවනාවක්. නාරොපා දැකල ඇතිනේ බුදු පිළිමවල තියෙන හස්ත මුද්‍රා. ඒ හස්ත මුද්‍රා ඇති බුදුපිළිමවලින් හැඟවෙන්නෙ බුදුහාමුදුරුවො සමාධි සුවයෙන් ඉන්නව කියල. පස්සෙ කාලෙක ධ්‍යාන මුද්‍රාව කියල ප්‍රසිද්ධ වුණෙත් ඔන්න ඔය මුද්‍රාව. අපි දැන් කරන්න යන භාවනා ක්‍රමය ලෝකෙ තියෙන උසස්ම භාවනාව කියල හැඳින්වුවත් ඒකෙ වරදක් නෑ.

මේක කරන භාවනාවක් නෙවෙයි. නොකිරීම පිළිබඳ භාවනාවක්. කිසිවක් නොකර අවධානයෙන් ඉන්න කොට ස්වභාවික නිසලතාවයේ හිත නිසල වෙනවා. එතකොට සිතට සිතම අරමුණු වෙනවා. යෝගියා ඒක දකින්නෙ සියුම් ආලෝකයක් හැටියට. ඒ ආලෝකය ලෞකික නිමිති මත රඳා පවතින එකක් නෙවෙයි. ඒ නිසා ඊට ශුද්ධාලෝකය යන නම යෙදෙනවා. මෙන්න මේ ශුද්ධාලෝකය දැක්කම ඒක නිර්වාණ ධාතුවට සමකරල හිතාගෙන ඒ දෙස බලාගෙන හිඳීම තමයි සරලම මහා මුද්‍රා අභ්‍යාසය. මේ ආකාරයට භාවනා කරනකොට ඉබේටම තමන්ගෙ අත්වල ඇඟිලිවලින් මුද්‍රා තැනෙනවා. මම දැන් මහා මුද්‍රාව පිළිබඳව ලියාගන්න ඕන ටික කියවන්නම්."

තිලෝපා මුනිවරයා මහාමුද්‍රා පාඩම කරන අතර නාරොපා ඒ සියල්ල අනලස්ව සටහන් කරගත්තේය.

මෙහි පහත දැක්වෙන්නේ තිලෝපා මුනිවරයා විසින් මහා මුද්‍රාව පිළිබඳ කරන ලද දෙසුමකි.



CS CamScanner

ගණනින් අසූ හතරක්වූ මුනිවරුන්ට පූජෝපහාර වේවා!
මහා මුද්‍රාවට පූජෝපහාර වේවා!

මහා මුද්‍රාව ඉගැන්විය හැකි දෙයක් නොව එය නුවණින් වටහා ගත යුත්තක්ම වෙයි.

හිස් අහස යමක් උපකාර නොකර පවත්නාසේම මහා මුද්‍රාවෙන් ලද සමාධියද නිමිත්තක් මත රඳා නොපවතී. මහාමුද්‍රාව යනු නිවනට ළංවූ අනිමිත්ත ධාතුව මත සිත සමාධිගත කිරීමකි.

දැන් අපි අනිමිත්ත සමාධියට පිවිසීමට සැරසෙමු.

කය සැහැල්ලු වෙන් තබාගෙන දෑස් ඉදිරියට යොමුකර හිස් අහස දෙස බලා හිඳින්න.

එකල්හි ඔබ සිතට එන අරමුණු බැහැර කළහොත් අවසානයේ සිතට සිතේම ප්‍රභාව අරමුණු වෙයි. සිතුවිලි ගලා ඒම නතරවූ වහාම අනිමිත්ත සමාධියට සමවදිනු ඇත. සිතට එහි ප්‍රකෘති මූලය මත සමාධිගතවනු ඇත.

හිස් අහසට පාටක් නොමැත. එය කළුද නොවේ. සුදුද නොවේ. හිස් කළ මනසද එබඳුය. එය කෙළෙස් දූහුවිලිවලින් මලින නොවී ප්‍රකෘති ස්වභාවයට පත්වෙයි. හිස්වූ මනස සහිතව ඒකාග්‍රතාවයට පත්වූ කල්හි සිතෙහි ප්‍රභාව ආලෝකයක් ලෙසට සිතට දර්ශනය වෙයි. ඒ ලෝකෝත්තර ආලෝක සංඥාව සංසාරයට අයත් නොවූවකි.

මහා මුද්‍රාවේදී උත්සාහයෙන් සිත ඒකාග්‍ර කිරීමක් සිදු නොවේ. සිතුවිලි ධාරාවන්ට ගලා යාමට ඉඩදෙන්න. ඒ සිතුවිලි දාමය මත ඇලීම් ගැටීම් ඇතිකර නොගන්න. එවිට අභ්‍යන්තරික සාමය උදා කරමින් සිත සමාධිගත වනු ඇත.

ධර්ම ග්‍රන්ථ වන පොත් කිරීම නිවනට කෙටි මඟ නොවේ. නිවනට කෙටිමඟ වනුයේ සියලු සංකල්පවලින් ද උගත් නූගත් සියලු දැනුමෙන් ද හිත හිස් කිරීමයි. එලෙස හිස් කළ සිත ලෝකෝත්තර සමාධිය තුළ ඒකාග්‍ර වනු ඇත. මිනිස්සු නිතර නිතර අපේක්ෂා භංගත්වයට පත්වෙති. එලෙස අපේක්ෂා භංගත්වයට පත්වීමට මූල හේතුවනම් ලෞකික ඉලක්ක හඹා යාමයි. අරමුණු වලින් සිත දෙපසට ඇදෙන කල මානසික



CamScanner

ආතතිය ඇතිවෙයි. ලෞකිකවූ සියලු දෙය මායාවන් බව සිතට ගන්න. ලෞකික ඉලක්ක මත ඇති බැඳීම අත්හල කල්හි සිත තුළ ලෝකෝත්තර සාමය ඇතිවෙයි.

ලෝකෝත්තර සමාධිය ඇතිකරගත් ප්‍රඥාවන්තයා අවිදු අඳුර දුරලා සසර සයුර තරණය කරයි.

නෑ මිතුරන්ගෙන් වෙන්ව ආරණ්‍යයකට යන්න. නැතිනම් හුදෙකලා වන්න. ලෝකෝත්තර සමාධිය සඳහා වූ භාවනාව ප්‍රගුණ කරන්න. සිත පූර්ණ සමාධියට එළඹෙන තෙක්ම නිරුත්සාහීව සමාධිය රැකෙන තෙක්ම මහා මුද්‍රාව ප්‍රගුණ කරන්න.

සියලු බුදුවරුන්ගේ දේශනාවන්හි කියවෙන ලෝකෝත්තර සමාධිය එයම වෙයි.

# 15

# අවසන් උපදේශය සෙරෙප්පු පහරකි!

තිලෝපා සුපුරුදු ලෙසම විටෙක සාන්තුවරයෙකු හැටියටත් තවත් විටෙක විහිළුකාරයෙකු ලෙසත් හැසිරුණේය. තව සමහර විටක ඔහු හැසිරුණේ කෝපාවිෂ්ඨවය. දිනපතාම තම ගුරුවරයා ඉදිරියේ පූජාවක් තැබීමට නාරොපා පුරුදුව සිටියේය. එක් දිනක ඔහුට සිය ගුරුවරයා වෙනුවෙන් පැන් පූජාවක් කිරීමට නොහැකි විය. තිලෝපා එයින් ප්‍රකෝපව නාරොපාට දරුණු ලෙස බැණ වැදුණේය.

නාරොපා තිලෝපා මුනිවරයා ඇසුරෙහි වසර දොළහක කාලයක් ජීවත් වෙමින් මහා මුද්‍රා, චක්‍ර සංවර, මිලාම්, බාර්ඩෝ, ඩ්‍රොන් ජුග්, පෝවා වැනි භාවනා සහ යෝග ක්‍රම රැසක් උගත්තේය. වසර දොළහක අධ්‍යාපනයෙන් පසු තව තවත් ඉගෙනීමට නාරොපා උනන්දු වූයේය.

"ගුරුතුමා තවත් මට ඉගෙන ගන්න දේවල් තියෙනවද?"

"මොකද නැත්තෙ. මෙහෙ වරෙං මා ළඟට!"

නාරොපා චකිතයෙන් යුතුව ගුරුවරයා ළඟට ගොස් එකත්පස්ව හිඳගත්තේය.

"මතක තියා ගන්නවා මං කියන දේ හොඳට. මොන දේ ඉගෙන ගත්තත් අවබෝධ කරගන්න වෙන්නෙ මෙන්න මෙතනින්" කියූ තිලෝපා සිය සෙරෙප්පුවක් ගලවා අතට ගෙන එයින් නාරොපාගේ හිස් මුදුනට පහර දුන්නේය.

තිලෝපා මුනිවරයා ක්‍රිස්තුවර්ෂ 1069දී බෙංගාලයේ දී පරිනිර්වාණයට පත්විය. නාරොපා තිලෝපා විසින් උගන්වන ලද ධර්ම කරුණු හා යෝග අභ්‍යාස එක් රැස් කර පොත් ගණනාවක්ම

ලිවිය. නාරොපාගේ පොත්වලට විදේශ රටවලින් පවා ඉල්ලුමක් ඇතිවිය. ටිබෙට් ජාතික මර්පා කිහිපවරක්ම පුල්ලහාරියට පැමිණ නාරොපා හමුවී මුදල් ගෙවා ධර්ම ග්‍රන්ථ ලබා ගත්තේය. නාරොපා ක්‍රිස්තුවර්ෂ 1100දී ප්‍රකෘති ශරීරය අතහැර සූක්ෂ්ම කයකට මාරුවිය.

තිලෝපා, නාරොපා යන මුනිවරුන් දෙදෙනාගේ ග්‍රන්ථ ටිබෙට් ජාතික මර්පා විසින් පරිවර්තනය කරනු ලැබ ඒවා ටිබෙට් කග්යු සම්ප්‍රදායට එක්විය. ටිබෙට් යෝගිවරයෙකු වූ මිලාරෙපා ඒ ඉගැන්වීම් අනුගමනය කර සත්‍යාවබෝධයට පත්විය. මිලාරෙපාගේ උපදෙස් අනුව විදසුන් වැඩූ ගම්පෝපා නම් භික්ෂුව අර්හත්ඵලයට පත්විය. එතැන් සිට නැවත රහතන්වහන්සේලාගේ යුගය උදාවිය. තිලෝපා, නාරොපා, මර්පා, මිලාරෙපා ගම්පෝපා යන නාමයන් සැදැහැවතුන්ගේ ගෞරව බහුමානයට පාත්‍ර විය.

***